*සැ. යු.* —2013.12.27 දින පළ වූ අංක 1,843 දරන ගැසට් පත්‍රයේ I:III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,844 - 2014 ජනවාරි මස 03 වැනි සිකුරාදා - 2014.01.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 8 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 12 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 17 |


*සැ. යු.* - තාක්ෂණ සහ සමාජ සේවා වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යාපන මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 දෙසැම්බර් මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජනවාරි මස 24 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජනවාරි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

7 - B 80799— 2,875 (2014/01 )
F 1 –

# තනතුරු - ඇබෑර්තු

## කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති විදුලි කාර්මික තනතුර සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අවම සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|---|
| විදුලි කාර්මික | 01 | රු. 12,210 - 130 x 10 - 145 x 10 - 160 x 10 - 170 x 12 - රු. 18,600 පී. එල් 2-2006 - ඒ | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 ක් සමත් වී තිබිය යුතු ය. | තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුනතාවක් ලබා තිබීම |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

(ii) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

(iii) අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පූර්වාසන්න වසර 03ක කාලයක් කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයකු විය යුතු ය.

(iv) අයදුම්කරුවන් යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.

(vi) අදාල ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද සඳහා විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(vii) අයදුම්කරුවන් ඒ ඒ තනතුරු ඉදිරියේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ/අනන්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

(ii) තෝරාගනු ලබන්නේ අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වය.

(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, දකුණු පළාතේ පළාත් සභාව, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා කරන්දෙණිය ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කර සිටිය යුතු ය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම් කරනු ලැබේ.

(ii) අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් සහතික හා ජාතික හැඳුනුම්පත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය :-

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතිකය;
3. අදාල කාල සීමාව සඳහා පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනයේ පිටපතක් හා මෑතක දී ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් තබන ලද ග්‍රාම නිලධාරී සහතිකය;
4. මෑතකදී ලබා ගත් චරිත සහතික 2ක්;
5. වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික තිබේ නම් එම සහතික.

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

06. *අයදුම්කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2014.01.24 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ සභාපති, කරන්දෙණිය ප්‍රාදේශීය සභාව, කරන්දෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඉල්ලුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "විදුලි කාර්මික තනතුර සඳහා" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(දැනටමත් රාජ්‍ය, පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය).

අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසිවල ඉදිරිපත් කළ යුතු ය. දක්වා ඇති උපදෙස්වලට පටහැනි, අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී බලතල කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

ගාමිණී අමරවංශ මුණුගොඩ,
සභාපති,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

2013 දෙසැම්බර් මස 11 වැනි දින,
කරන්දෙණිය,
කරන්දෙණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

## ආදර්ශ අයදුම්පත්‍රය

**...........................තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍රය**

01. (අ) මුලකුරු සමග නම :————.
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

02. (අ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
(ආ) ස්ථිර පදිංචි ලිපිනය :————.

03. ස්ත්‍රී පුරුෂ භාවය :————.

04. (අ) උපන් දිනය : අවුරුද්ද :————. මාසය:————. දිනය:————.
(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට (2014.01.24) වයස : අවු. :————. මාස :————. දින :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :————.

06. විවාහක/අවිවාහක බව :————.

07. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද ? ලියාපදිංචියෙන් ද ? යන වග :————.

08. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරු කර තිබේ ද? එසේ නම් විස්තර. :————.

09. අධ්‍යාපන සුදුසුකම් :

(අ) විභාගයේ නම :————.
(ආ) විභාග අංකය :————.
(ඇ) සමත් වර්ෂය :————.
(ඈ) සමත් විෂයයන් :————.

10. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :————.

11. ඔබ දැනටමත් මෙහි ආදේශක සේවය කරන්නේ නම් සේවා කාලය හා විස්තර, එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/තාවකාලික/දීමනා/ආදේශක සඳහා ද යන වග) :————.

12. වෙනත් සුදුසුකම් :————.

13. මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. ආයතන ප්‍රධානියාගේ සහතිකය (දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි)

මෙම අයදුම්කරු වන..........................මයා./මිය./මෙනවිය දැනටමත් මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .................වශයෙන් සේවය කරනු ලබන අතර. ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කිරීමට එකඟ වෙමි. ඔහු/ඇය කුමන ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව ද මින් සහතික කරන අතර, අයදුම්පත් නිර්දේශ කරමි./නොකරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

01-10

---

**හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව**

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| සෞඛ්‍ය කම්කරු | 01 | (පීඑල් 1- 2006ඒ 6/2006 (iv) රා. ප. ච. ලේ. අනුව) රු. 11,730-10x 120-10x 130-10x 145 - 12x 160-රු. 17600 (හතරවැනි වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | අවම වශයෙන් 8 ශ්‍රේණිය/ 9 වසර සමත් වී තිබීම. |

*වෙනත් සුදුසුකම් :-*

1. අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය.
2. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
3. හාරිස්පත්තුව බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව අදාල නොවේ.)
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙක් වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතු ය.
6. රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූ හෝ රා. ප. පා. ච. ලේ. 44/90 යටතේ විශ්‍රාම ලැබූ අයෙකු නොවිය යුතු ය.
7. හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ දැනට අනියම් ආදේශක, තාවකාලික, කොන්ත්‍රාත් ස්වේච්ඡාවෙන් සේවය කරනු ලබන සේවක/සේවිකාවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරේ.

*පොදු කොන්දේසි :-*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

3. තෝරාගනු ලබන සේවකයින් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.
4. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි හා මුදල් රෙගුලාසිවලට ද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවය හෝ රජයේ දෙපාර්තමේන්තුව හෝ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.
5. පත්වීම ලැබීමෙන් පසු අවුරුදු තුනක කාලයක දී ස්ථිර කිරීම සම්බන්ධයෙන් සළකා බැලේ.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :-*

මෙහි පහත සඳහන් කර ඇති ආදර්ශ ආකෘතිය පරිදි 12 x 8 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් සකස් කර 2014.01.18 දිනට පෙර ''ලේකම්, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව, බරිගම, වැරැල්ලගම'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතු ය. කවරයේ වම්පස උඩ කෙළවරේ අදාළ තනතුරේ නම සඳහන් කළ යුතු ය. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුවේ :-

01. උප්පැන්න සහතිකය,
02. අධ්‍යාපන සහතික,
03. පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය,
04. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්,
05. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතිකය,
06. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

*බඳවා ගැනීමේ ක්‍රමය :-*

1. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට හා ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කර ලකුණු ප්‍රමුඛතාවය මත සුදුසුකම් ලබන අයදුම්කරුවන් අදාළ තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

2. මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුර දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීමේ බලය හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

ඩී. ජී. එම්. බී. රණසිංහ,
ලේකම්,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2013 දෙසැම්බර් මස 06 වැනි දින,
බරිගම, වැරැල්ලගම,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

**සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

02. තැපැල් ලිපිනය :————.

03. උපන් දිනය : අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2014.01.18) වයස : අවු. :————. මාස :————. දින :————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

06. විවාහක/අවිවාහක බව :————.

07. ජාතික හැඳුනුම්පත් අංකය :————.

08. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? :————.

එසේ නම් පරම්පරාවෙන් ද/ලියාපදිංචි වීමෙන් ද යන වග :————.

09. හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය :————.

10. අධ්‍යාපන සුදුසුකම් ඃ

වර්ෂය :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

11. වෘත්තීය හා වෙනත් සුදුසුකම් (සහතික/බලපත්‍ර) :————.

12. සේවා පළපුරුද්ද :————.

13. වෙනත් සුදුසුකම් :————.

14. යම්කිසි වරදකට හෝ කෙදිනක හෝ උසාවියක දී වැරදිකරු වී ඇත්නම් ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න. :————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත් ඒවා බව සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට සිදුවන බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

01-129

# පළාත් පාලන නිවේදන

**හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව**

2014 වර්ෂයට විනෝද බදු පැනවීම

**යෝජනාව**

(267 වැනි අධිකාරිය වන) විනෝද බදු ආඥා පනතේ 2 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ මෙම සභාව විසින් සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පැවැත්වෙන (ආඥාපනතෙහි විස්තර කොට ඇති පරිදි වූ) විනෝද කටයුතු සඳහා ඇතුල්වීම පිණිස අය කරනු ලබන ගාස්තුවලින් 10% බද්දක් මෙම යෝජනාව *ගැසට් පත්‍රයේ* පළවන දින සිට පනවා අය කළ යුතු යැයි මෙයින් නිවේදනය කරමි.

අනුර වික්‍රමසිංහ,
සභාපති,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 29 වැනි දින,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව.

01-16/8

## හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව

### මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා බලතල පැවරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 8 (2) වගන්තිය යටතේ සභාපතිවරයා වෙත පැවරී ඇති බලතල හා 216 වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වෙත පැවරීම.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 8(2) වගන්තිය යටතේ සභාපතිවරයා වෙත පැවරී ඇති බලතල හා 216 වගන්තිය යටතේ මෙම සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හොරොව්පොතාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත මහජන සෞඛ්‍ය කටයුතු වලට අදාලව පහත සඳහන් ලිඛිත නීති පනත් අතුරු ව්‍යවස්ථා හා ආඥා පනත් මගින් මෙම සභාවට පැවරී ඇති බලතල කාර්ය හා කර්තව්‍ය සභාපතිවරයාගේ පොදු පාලනයට යටත්ව පහත සඳහන් මහජන සෞඛ්‍ය කොට්ඨාශ වල රාජකාරි ඉටුකරනු ලබන ක්ෂේත්‍රයන් ඇතුළත හා රාජකාරි ආවරණය කරනු ලබන ක්ෂේත්‍රයන් ඇතුළත ක්‍රියාවේ යෙදවීම පිණිස මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වෙත බලතල පවරනු ලැබේ.

මහජන සෞඛ්‍ය කොට්ඨාස :

හොරොව්පොතාන මහජන සෞඛ්‍ය බල ප්‍රදේශයේ-

(i) හොරොව්පොතාන කොට්ඨාසය
(ii) කපුගොල්ලෑව කොට්ඨාසය
(iii) මොරකෑව කොට්ඨාසය

බලතල පැවරිය යුතු අතුරු ව්‍යවස්ථා පනත් සහ ආඥා පනත් :-

1. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ (iv) කොටසේ මහජන සෞඛ්‍යයට අදාළ කොටස් සහ සභාපතිවරයා විසින් අවස්ථානුකූලව පවරනු ලබන අනෙකුත් වගන්ති.

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (i) වගන්තියෙහි (xxv), (xxx), (xxxi) උප වගන්ති.

3. 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත යටතේ සාදන ලද අංක 520/7 දරන 1985.08.23 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද අතුරු ව්‍යවස්ථා.

4. හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව විසින් පනවා ඇති අනෙකුත් අතුරු ව්‍යවස්ථා වල මහජන සෞඛ්‍යට අදාළ කොටස්.

5. 230 වන අධිකාරිය වූ පීඩන ක්‍රියා ආඥාපනත

6. 1893 අංක 09 දරන ගෝඝාතක ආඥාපනත

7. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ පරිසර දූෂණයන්ට අදාළ හා පරිසර බලපත්‍ර වලට අදාළ කරුණු පරීක්ෂා කිරීම, වාර්තා කිරීම, පුද්ගලික සුසාන හා පොදු සුසාන පිළිබඳ ආඥාපනත

8. පුද්ගලික සුසාන හා පොදු සුසාන පිළිබඳ ආඥාපනත

9. 268 වන අධිකාරිය පනත හා නගර සංවර්ධන ආඥාපනත

10. 1941 අංක 13 දරන ජලභීතිකා රෝගය පිළිබඳ ආඥාපනත

11. 1938 අංක 26 දරන සතුන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත හා

මෙම බලතල පැවරීම 2013.10.29 වැනි දින පැවති මාසික සභාවේදී ගනු ලැබූ ඒකමතික අනුමැතිය අනුව සිදු කරන ලද බව දන්වා සිටිමි.

අනුර වික්‍රමසිංහ,
සභාපති,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 29 වැනි දින,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව.

01-16/9

---

## රඹුක්කන ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2013.07.30 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා සම්මත කරන ලද යෝජනාව අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් මංමාවත් අදාල ඉඩම් හිමියන් විසින් සභාව වෙත දෙන ලද ලිඛිත කැමැත්ත අනුව එකිනෙක ඉදිරියේ ඇති දිග පළල අනුව සභාව සතු වන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ප්‍රදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ නම් කිනම් කරුණක් නිසාද යන්න සඳහන් කල ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 30 ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුළ යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපලක් හැටියට සළකා එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ඊ. එම්. ඒ. එන්. බී. හඳගම,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2013 නොවැම්බර් මස 05 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| *මාර්ග විස්තරය* | *දිග* | *පළල* |
|---|---|---|
| | මීටර් 255 (836'-0") | මීටර් 3.65 (12'-0") |

මාර්ගයේ නම - එන්. පී. ධර්මවර්ධන මාවත
වසම - මොළගොඩ

වේකොළදෙනියෙන් ආරම්භව වම්පසින් ධර්මවංශ අබේනායක යන අයට අයත් ගෙදරවත්ත, එච්. ජී. ඩබ්ලිව්. එම්. අබේරත්නට අයත් බෙලිගහවත්ත, ජී. ජී. ස්වර්ණතිලකා යන අයට අයත් බෙලිගහවත්තේ පහල කොටසද, ඩී. ජී. කුසුමාවතී, එන්. පී. එම්. රෝහිනීදේවසුරේන්ද්‍ර, එන්. පී. එම්. නිරෝෂා කුමුදුනී දේවසුරේන්ද්‍ර, එස්. එච්. පී. එස්. කුමාරසිරි, සමුද්‍රා ගෝතමී පණ්ඩිතරත්න, රත්නවතී අමරතුංග, එන්. පී. ස්වර්ණවතී, එච්. ජී. යූ. අබේරත්න යන අයවලුන්ට අයත් වාගොල්ලවත්ත යන ඉඩමෙන් මායිම් වන්නා වූ ද,

දකුණු පසින් ඇළ රක්ෂිතයෙන් මායිම් වන්නා වූ වාගොල්ල වත්ත දක්වා වූ මාර්ගය.

01-124/1

## රඹුක්කන ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2013.10.29 දින පවත්වන ලද සභා රැස්වීමේ දී සභා සම්මත කරන ලද යෝජනාව අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් මංමාවත් අදාල ඉඩම්හිමියන් විසින් සභාව වෙත ලබා දෙන ලද ලිඛිත කැමැත්ත අනුව එකිනෙක ඉදිරියේ ඇති දිග, පළල අනුව සභාව සතු වන බව මෙයින් ප්‍රසිද්ධියට පත්කරනු ලැබේ.

ප්‍රදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ නම් කිනම් කරුණක් නිසාද යන්න සඳහන් කළ ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 30 ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුළ යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුනහොත් ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපලක් හැටියට සළකා එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ඊ. එම්. ඒ. එන්. බී. හඳගම,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2013 නොවැම්බර් මස 05 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

මාර්ගයේ විස්තරය

| දිග | පළල |
|---|---|
| මීටර් 275 | මීටර් 2.43 |

මාර්ගයේ නම - මුවපිටිය ටැම්පිට විහාරස්ථානයේ සිට කිරිවන්දෙනිය විහාරස්ථානය දක්වා මාර්ගය

වසම - කිරිවන්දෙනිය

හිගුල් කුඹුර අසලින් ආරම්භව යූ. ආර්. එම්. එම්. වීරවර්ධන, ඩබ්ලිව්. ඒ. ඩිංගිරිඅම්මා අයට අයත් හිඹුල් කුඹුරද, ජේ. ඒ. සෝමරත්න යන අයට අයත් වල්කුකුලන්දෙනිය කුඹුර හා හිගුල් කුඹුරෙන් මායිම් වන්නා වූ ද දකුණු පසින් යූ. ආර්. එම්. එම්. වීරවර්ධන යන අයට අයත් හිඹුල් කුඹුර ද, ඩබ්ලිව්. ඒ. ඩිංගිරිඅම්මා යන අයට පල්කඩ හා හිඹුල් කුඹුරද, ජේ. ඒ. අනුලාවතීට හා ආර්. එම්. නවරත්න යන අයට අයත් හිඹුල් කුඹුරෙන්ද මායිම් වන්නා වූ, මුවපිටිය ටැම්පිට විහාරස්ථානයේ සිට කිරිවන්දෙනිය විහාරස්ථානය දක්වා මාර්ගයේ හිගුල් කුඹුර සිට වලිකුකුලන්දෙනිය දක්වා මාර්ගය.

මාර්ග විස්තරය

| දිග | පළල |
|---|---|
| මීටර් 292.0<br>(956'.0") | මීටර් 3.0<br>(10'-0") |

මාර්ගයේ නම - වඩුගෙවත්ත හරහා ගල්කොටුව දක්වා මාර්ගය
වසම - දෙල්දෙනිය

දෙල්දෙනිය ප්‍රාදේශයෙන් ආරම්භව වම්පසින් කේ. එම්. ජයසුන්දර, එල්. ඩබ්ලිව්. ජේ. මංගලිකා, එල්. ජී. රත්නවතී යන අයට අයත් සියඹලා කුඹුරද, හල්පිටියේ රතනවංශ හිමිට අයත් ගල්කොටුව කුඹුරද, එල්. ජී. ඩී. එස්. ප්‍රේමරත්නට අයත් වඩුගෙවත්ත ඉඩමද, එම්. ප්‍රේමරත්න යන අයට අයත් ගල්කොටුව යන කුඹුරෙන් මායිම් වන්නා වූද, දකුණු පසින් ඩබ්ලිව්. ඩී. නන්දදේව හා ටී. ඒ. ජී. බී. දිසානායක යන අයට අයත් කුඩාමුලාචාරිගේ වත්තද පී. ඒ. එස්. ගාමිණී ජයවීර, එම්. සෝමරත්න යන අයට අයත් වඩුගෙවත්තද, එල්. ජී. චන්ද්‍රරත්න හා එල්. ජී. ගුණරත්න යන අයට අයත් කිරියලෑවත්ත යන ඉඩම්වලින් මායිම් වන්නා වූ වඩුගෙවත්ත හරහා ගල්කොටුව වත්ත දක්වා මාර්ගය.

මාර්ගයේ විස්තරය

| දිග | පළල |
|---|---|
| මීටර් 91.0<br>(300' - 0") | මීටර් 3.0<br>(10' - 0") |

මාර්ගයේ නම - පීළිකුඹුර පහල අරඹ නිවෙස්වලට හා කමතට යන මාර්ගය
වසම - මුවපිටිය

මුවපිටිය පීළිකුඹුර මාර්ගයෙන් ආරම්භව වම් පසින් කේ. ඒ. පොඩිමහත්තයා, බී. ජී. නන්දාවතී මැණිකේ, ඩබ්ලිව්. ඒ. තිලකාවතී යන අයට අයත් පීළිකුඹුර ඉඩමෙන්ද,

දකුණු පසින් ඩබ්ලිව්. ඒ. එල්. බී. වීරසේකර, ඩබ්ලිව්. ඒ. ඒ. ඩබ්ලිව්. බංඩාර යන අයවලුන්ට අයත් මුල්වක්කඩ කුඹුරෙන්ද, ඩබ්ලිව්. ඒ. රණවීර බණ්ඩා යන අයට අයත් පීළිකුඹුර ඉඩමෙන් මායිම් වන්නා වූ පීළිකුඹුර පහළ අරඹ හා කමත දක්වා වූ මාර්ගය.

01-124/2

---

## රඹුක්කන ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2013.11.26 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා සම්මත කරන ලද යෝජනාව අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් මංමාවත් අදාල ඉඩම් හිමියන් විසින් සභාව වෙත දෙන ලද ලිඛිත කැමැත්ත අනුව එකිනෙක ඉදිරියේ ඇති දිග පළල අනුව සභාව සතු වන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ප්‍රදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ නම් කිනම් කරුණක් නිසාද යන්න සඳහන් කළ ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 30 ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුළ යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපලක් හැටියට සළකා එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ඊ. එම්. ඒ. එන්. බී. හඳගම,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2013 දෙසැම්බර් මස 05 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මාර්ග විස්තරය

| | දිග | පළල |
|---|---|---|
| | මීටර් 100.0 | මීටර් 3.0 |
| | (328' -0") | (10'-0") |

මාර්ගයේ නම - ඊරියගොල්ල බතලහේන මාර්ගය
වසම - ඊරියගොල්ල

ඊරියගොල්ල ප්‍රදේශයෙන් ආරම්භව වම් පසින් ඊ. ඩී. එස්. හේමචන්ද්‍ර, වී. ජී. නන්දසේන, හා ඊ. ඒ. විජේරත්න යන අයවලුන්ට අයත් බතලහේන ඉඩමෙන් මායිම් වන්නා වූද, දකුණු පසින් එස්. සෙනෙවිරත්න, ජේ. ඒ. ඒ. ජයකොඩි, පී. බී. ප්‍රේමරත්න යන අයවලුන්ට අයත් බතලහේන යන ඉඩමෙන් මායිම් වන්නා වූ ඊරියගොල්ල බතලහේන මාර්ගය

මාර්ග විස්තරය

| | දිග | පළල |
|---|---|---|
| | මීටර් 112.0 | මීටර් 3.35 |

මාර්ගයේ නම - තැඹිලිකුඹුර වත්ත මාර්ගය
වසම - හිරිවඩුන්න

අන්දිරමඩ ප්‍රදේශයෙන් ආරම්භව වම් පසින් පී. ජී. ධම්මික ගුණවීර, බී. ජී. එන්. ජයතිලක, ඩබ්ලිව්. ඩී. ඒ. ප්‍රියන්ත, එම්. එස්. පී. පෙරේරා, ඒ. එස් ද සොයිසා යන අයවලුන්ට අයත් තැඹිලිකුඹුර වත්ත යන ඉඩමෙන් මායිම් වන්නා වූ ද, දකුණු පසින් ජේ. එම්. කේ. ඩී. ජයසුන්දර, එච්. ජී. පී. සෙනවිරත්න, එන්. එම්. ඒ. ඩී. නවරත්න, එම්. අයි. සී. කේ. ඒකනායක, එච්. එම්. ආර්. ටී. කේ. තිලකරත්න යන අයවලුන්ට අයත් තැඹිලිකුඹුර වත්ත යන ඉඩම්වලින් මායිම් වන්නා වූ තැඹිලිකුඹුර වත්ත මාර්ගය

මාර්ග විස්තරය

| | දිග | පළල |
|---|---|---|
| | මීටර් 207.0 | මීටර් 4.5 |

මාර්ගයේ නම - ඉඹුල්ගස්දෙනිය අංක 01 පටුමග (වී මෝල පාර)
වසම - ඉඹුල්ගස් දෙනිය

ඉඹුල්ගස්දෙනිය හන්දියෙන් ආරම්භව වම් පසින් ජේ. ඒ. පියදාස, එස්. ඒ. ඒ. එච්. සීලමන් ආරච්චි, අයි. පී. සෝමරත්න අයවලුන්ට අයත් ඉඹුල්ගස්දෙනියවත්ත ඉඩමෙන් මායිම් වන්නා වූ ද, දකුණු පසින් වානක මධුසංඛ, ඩී. ජී. ගුණපාල, ඩී. ආර්. එස්. ආර්. බණ්ඩාර, ජී. ආර්. වී. බණ්ඩාර, කේ. පී. ආර්. ඩී. බණ්ඩාර, ඩී. ඩබ්ලිව්. ආරියසේන යන අයවලුන්ට අයත් ටැංකියවත්ත ඉඩමෙන් මායිම් වන්නා වූ ඉඹුල්ගස්දෙනිය අංක 01 පටුමග මාර්ගය

01-124/3

---

### බණ්ඩාරවෙල මහ නගර සභාව

සණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ ඌව පළාතේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍ර* අංක 1778/45 - 2012.10.05 දිනැති (අතිවිශෙෂ) *ගැසට් පත්‍රයේ* පළකර ප්‍රකාශයට පත් කරනු ලැබුවා වූ එකී සම්මත ව්‍යවස්ථා, මහා නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරය) 267 වන වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 129, 130, 131, යන වගන්තිවල සඳහන් කාර්යයන් සම්බන්ධව එකී ආඥා පනතේ 272 වැනි වගන්තියේ 5 වැනි උප වගන්තියේ (ආ) ඡේදයෙන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට බලය පැවරී ඇති හෙයින් 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ 3 වන උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඌව පළාතේ බණ්ඩාරවෙල මහ නගර සභාව මඟින්ද පිළිගැනීම සුදුසු බවට බණ්ඩාරවෙල මහ නගර සභාව විසින් තීරණය කර ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරමි.

දේශබන්දු එල්. ඩබ්. චමින්ද විජේසිරි,
නගරාධිපති,
බණ්ඩාරවෙල මහ නගර සභාව.

2013 නොවැම්බර් මස 28 වැනි දින,
බණ්ඩාරවෙල,
මහ නගර සභා කාර්යාලයේදීය.

01-91

---

### දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

2014 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව මගින් 2013 වර්ෂයේ ඔක්තෝබර් මස 29වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 11 ː 4 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් බදු සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික 04 කින් දෙහිඕවිට ප්‍රාදේශීය සභා කාර්යාලය ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2014 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර දෙහිඕවිට ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු ප්‍රමාණයෙන් 10% ක වට්ටමක්ද 2014 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවනු ලැබේ.

කේ. ඒ. අයි. අමිල රුවන් කන්දෙආරච්චි,
සභාපති,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.

2013 නොවැම්බර් මස 04 වැනි දින,
දෙහිඕවිට,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

#### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වලට පැවරී ඇති බලතල ප්‍රකාර දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත පිහිටි පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල පිහිටි නිවාස වල ගොඩනැගිලි වල ඉඩම් වල හා

ගෙපත් සඳහා 2014 වර්ෂය සඳහා තක්සේරු කරන ලද නව තක්සේරුව පිළිගැනීමට හා ඒ අනුව කටයුතු කිරීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමින්,

(01) පහත සඳහන් උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල පිහිටි සෑම නිශ්චල දේපළක් මත 4%, 6% හා 7% වරිපනමක් ද, 2014 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ ඒ වරිපනම් එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු හතර (4) තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් දෙහිඕවිට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

උපලේඛනය

1964.06.26 දිනැති අංක 14080 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවී ඇති දෙහිඕවිට සුලු නගර සහා බල ප්‍රදේශයේ -

| | |
|---|---|
| කොට්ඨාස අංක 01 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 940 - 1000 | 7% |
| කොට්ඨාස අංක 01 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 1000/1 - 1000/17 | 6% |
| කොට්ඨාස අංක 01 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 1002 - 1020/6 | 7% |
| කොට්ඨාස අංක 01 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 1020/7 දක්වා | 4% |
| කොට්ඨාස අංක 01 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 1020/8 - 1068 | 7% |
| කොට්ඨාස අංක 01 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 1084 - 1084/3 | 6% |
| කොට්ඨාස අංක 01 - දංගොල්ල පාර/වම - තක්සේරු අංක 3-65/1 | 7% |
| කොට්ඨාස අංක 01 - දංගොල්ල පාර/දකුණ - තක්සේරු අංක 8 - 30ඒ | 7% |
| කොට්ඨාස අංක 01 - දංගොල්ල පාර/දකුණ - තක්සේරු අංක 32 - 62 | 6% |
| කොට්ඨාස අංක 01 - ගුරුගල්ල පාර/වම - තක්සේරු අංක 1-93 | 7% |
| කොට්ඨාස අංක 01 - ගුරුගල්ල පාර/වම - තක්සේරු අංක 97 - 165/5 | 6% |
| කොට්ඨාස අංක 01 - ගුරුගල්ල පාර/වම - තක්සේරු අංක 175 -255 | 4% |
| කොට්ඨාස අංක 01 - මුස්ලිම් පල්ලිය පාර/වම - තක්සේරු අංක 3 - 37 | 7% |
| කොට්ඨාස අංක 01 - මුස්ලිම්පල්ලිය පාර/වම - තක්සේරු අංක 6/38/12 | 7% |
| කොට්ඨාස අංක 01 - සීතා විද්‍යාල පාර/වම - තක්සේරු අංක 3 - 61 | 7% |
| කොට්ඨාස අංක 01 - සීතා විද්‍යාල පාර/දකුණ - තක්සේරු අංක 4 - 980/1/සී/1/2 | 7% |
| කොට්ඨාස අංක 01/02 - අවිස්සාවේල්ල පාර/වම - තක්සේරු අංක 611 - 803 | 6% |
| කොට්ඨාස අංක 02 - අවිස්සාවේල්ල පාර/වම - තක්සේරු අංක 807 - 847 | 6% |
| කොට්ඨාස අංක 02 - අවිස්සාවේල්ල පාර/වම - තක්සේරු අංක 840-1019/10 | 7% |
| කොට්ඨාස අංක 02 - අවිස්සාවේල්ල පාර/වම - තක්සේරු අංක 1019/15 - 1019/24 | 6% |
| කොට්ඨාස අංක 02 - අවිස්සාවේල්ල පාර/වම - තක්සේරු අංක 1019/24 - 1047 | 7% |
| කොට්ඨාස අංක 02 - අවිස්සාවේල්ල පාර/වම - තක්සේරු අංක 1047/7 - 1047/36 | 6% |
| කොට්ඨාස අංක 02 - අවිස්සාවේල්ල පාර/වම - තක්සේරු අංක 1047/37 - 1067 | 7% |
| කොට්ඨාස අංක 02 - සුගතාරාම පාර/වම - තක්සේරු අංක 3 - 31 | 7% |
| කොට්ඨාස අංක 02 - සුගතාරාම පාර/වම - තක්සේරු අංක 31 - 41/3 | 4% |
| කොට්ඨාස අංක 02 - සුගතාරාම පාර/දකුණ - තක්සේරු අංක 8/16 - 11 | 7% |
| කොට්ඨාස අංක 02 - සුගතාරාම පාර/දකුණ - තක්සේරු අංක 26 - 30 | 6% |
| කොට්ඨාස අංක 02 - සුගතාරාම පාර/දකුණ - තක්සේරු අංක 32 - 38 | 4% |
| කොට්ඨාස අංක 03 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 644 - 844 | 4% |
| කොට්ඨාස අංක 03 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 844/2 - 844/5 | 6% |
| කොට්ඨාස අංක 03 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 844/8 - 844/11 | 4% |
| කොට්ඨාස අංක 03 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 850 - 872 | 6% |
| කොට්ඨාස අංක 03 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 872ඒ - 932 | 7% |
| කොට්ඨාස අංක 03 - ගුරුගල්ල පාර/දකුණ - තක්සේරු අංක 4 - 100ඒ | 7% |
| කොට්ඨාස අංක 03 - ගුරුගල්ල පාර/දකුණ - තක්සේරු අංක 102 - 310 | 6% |
| කොට්ඨාස අංක 04 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 78 -338 | 7% |
| කොට්ඨාස අංක 04 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 342 - 408ඒ | 6% |
| කොට්ඨාස අංක 04 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 408/1 - 636/1 | 4% |
| කොට්ඨාස අංක 04 - පිරිවෙන පාර/වම - තක්සේරු අංක 1- 103 | 7% |
| කොට්ඨාස අංක 04 - පිරිවෙන පාර/දකුණ - තක්සේරු අංක 2 - 114 | 7% |
| කොට්ඨාස අංක 05 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 2 - 76/6 | 7% |
| කොට්ඨාස අංක 05 - ගිණිගත්හේන පාර/වම - තක්සේරු අංක 1 - 224 | 7% |
| කොට්ඨාස අංක 06 - ගිණිගත්හේන පාර/වම - තක්සේරු අංක 243/1 - 245/22 | 7% |
| කොට්ඨාස අංක 05 - ගිණිගත්හේන පාර/වම - තක්සේරු අංක 247 - 317 | 7% |
| කොට්ඨාස අංක 03 - ගිණිගත්හේන පාර/වම - තක්සේරු අංක 317/10 | 6% |
| කොට්ඨාස අංක 05 - ගිණිගත්හේන පාර/වම - තක්සේරු අංක 325 - 401 | 7% |
| කොට්ඨාස අංක 05 - පිරිවෙන පාර/වම - තක්සේරු අංක 113 - 273 | 7% |
| කොට්ඨාස අංක 03 - පිරිවෙන පාර/වම - තක්සේරු අංක 275 - 345 | 6% |

කොට්ඨාස අංක 05 - පිරිවෙන පාර/දකුණ
- තක්සේරු අංක 116 - 276 7%

කොට්ඨාස අංක 06 - අවිස්සාවේල්ල පාර/වම
- තක්සේරු අංක 7 - 83/2 7%
කොට්ඨාස අංක 06 - දැරණියගල පාර/වම
- තක්සේරු අංක 3 - 173/4 6%
කොට්ඨාස අංක 06 - දැරණියගල පාර/දකුණ
- තක්සේරු අංක 10 - 80 6%
කොට්ඨාස අංක 06 - ගිණිගත්හේන පාර/දකුණ
- තක්සේරු අංක 2 - 380 7%
කොට්ඨාස අංක 06 - කනංගම පාර/දකුණ
- තක්සේරු අංක 6 - 28/12 7%

කොට්ඨාස අංක 07 - අවිස්සාවේල්ල පාර/වම
- තක්සේරු අංක 85 - 287/2/බී 7%
කොට්ඨාස අංක 07 - අවිස්සාවේල්ල පාර/වම
- තක්සේරු අංක 287/3 - 605 6%
කොට්ඨාස අංක 07 - අල්ගොඩ පාර/වම
- තක්සේරු අංක 1 - 51 7%
කොට්ඨාස අංක 07 - අල්ගොඩ පාර/දකුණ
- තක්සේරු අංක 71 -171 6%
කොට්ඨාස අංක 07 - අල්ගොඩ පාර/දකුණ
- තක්සේරු අංක 4 - 32 7%
කොට්ඨාස අංක 07 - අල්ගොඩ පාර/දකුණ
- තක්සේරු අංක 34 - 168 6%
කොට්ඨාස අංක 07 - ඇහැලියගොඩ පාර/වම
- තක්සේරු අංක 3 - 181 7%
කොට්ඨාස අංක 07 - ඇහැලියගොඩ පාර/දකුණ
- තක්සේරු අංක 106 -132 7%
කොට්ඨාස අංක 07 - මල්වරුෂාව තිඹිරිපොල පාර/දකුණ
- තක්සේරු අංක 11 - 21 6%
කොට්ඨාස අංක 07 - මල්වරුෂාව තිඹිරිපොල පාර/දකුණ
- තක්සේරු අංක 27 - 41 4%
කොට්ඨාස අංක 07 - මල්වරුෂාව තිඹිරිපොල පාර/වම
- තක්සේරු අංක 100/17 දක්වා 6%
කොට්ඨාස අංක 07 - ක්‍රීඩා පිටිය පාර /දකුණ
- තක්සේරු අංක 2 - 22/4 7%

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) යටතේ කෑගල්ල ප්‍රාදේශීය පළාත් පාලන කොමසාරිස්තුමාගේ අංක සී/4 හා 1988/07/04 දින අනුමත කළ දියුණු ප්‍රදේශ :

(i) මාදොල - අවිස්සාවේල්ල - රත්නපුර පාරේ 61/1 බෝක්කුවේ සිට 62/3 බෝක්කුව දක්වා දම්වැල් 02ක් - 7%

(ii) (පනාවල) - දෙහිඕවිට-ඇහැලියගොඩ පාරේ 0/5 බෝක්කුවේ සිට 62/3 බෝක්කුව දක්වා දම්වැල් 02ක් - 3%

(iii) (නාපාවල) - තල්දූව-ගුරුගල්ල පාරේ 2/3 බෝක්කුවේ සිට දයිගල දෙසට 1/6 බෝක්කුව දක්වා මුස්ලිම් පල්ලිය පාරේ දම්වැල් 02ක් - 2%

(iv) මාගම්මන - අවිස්සාවේල්ල - ගිනිගත්හේන පාරේ 11/3 බෝක්කුවේ සිට 14/2 දක්වා දම්වැල් 02 ක් - 4%

01-54/1

---

# විවිධ දැන්වීම්

## වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව

සතුන් වදහිංසා ආඥාපනත (පරිච්ඡේදය 272) 7(2) වැනි කොටස යටතේ දැන්වීම් - 2014

වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල ප්‍රාදේශීය සභාවෙන් සමත් වූ බදුකරුවන්ට කොන්ත්‍රාත්කරුවන්ට ලබා දුන් යම් කිසි මස් කඩවල්, සතුන් වද හිංසා පනතේ (පරිච්ඡේදය 272) 17(2) කොටස යටතේ මා හට දී ඇති බලතල අනුව සඳහන්ව ඇති උපලේඛනය අනුව දක්වා ඇති දිනවල රජයේ සම්මත වූ දිනවලත් මා විසින් වරින්වර දැනුවත් කරනු ලබන දිනවලත් සතුන් විකිණීම ද, විකුණනු පිණිස එල්ලීම ද මස් කඩවල් විවෘතකර තබා ගැනීම මුළින්ම වැලැක්විය යුතු බව මෙයින් දන්වා සිටිමි.

ක. සිවලිංගම්,
සභාපති,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව.

2013 නොවැම්බර් මස 25 වැනි දින,
නේරියකුලම් වීදිය,
නෙලුක්කුලම්,
වවුනියාව
වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාකාර්යාලයේ දී ය.

### උපලේඛනය

1. ශ්‍රී ලංකා නිදහස් දිනය.
2. මහා සිව රාත්‍රිය.
3. වෙසක් පුර පසලොස්වක දිනය. (රජයේ සම්මත වූ දිනවල්).
4. ලෝක සත්ව දිනය.
5. මාසේ පුර පසලොස්වක දිනය.

01-125/1

---

## වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව

1987 වර්ෂයේ අංක 15 වැනි ප්‍රාදේශීය සභා පනතේ නිශ්චල දේපළ සඳහා වන දැන්වීම - 2014

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 18 (ඇ) 11 වගන්තියෙන් පැහැදිලිව මා වෙත පවරා ඇති බලතලවලට අනුව වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව පරිපාලන සීමා තුළ දක්නට ලැබෙන වංචල නිශ්චල දේපළ හා ඒවායේ වගකීම් පැවරීම සම්බන්ධයෙන් අප සභාවට හිමි මුලද්‍රව්‍ය හාරා රැගෙන යන අයගෙන් විශේෂ සංවර්ධන ගාස්තුවක් පහත

සඳහන් පරිදි අයකිරීමට 2013.07.18 වැනි දිනැති 01 වන අංක දරන තීරණය සම්මත කොට ක්‍රියාත්මක කරන බව මෙයින් ප්‍රසිද්ධ කර දන්වා සිටිනු ලැබේ.

| *අනු. අංකය* | *ස්වභාවය* | *අයකිරීම් රු. ශ.* |
|---|---|---|
| 01. | ගල් කියුබ් එකක් පටවාගෙන යාමට | 70 0 |
| 02. | ග්‍රැවල්පස් කියුබ් එකක් පටවාගෙන යාමට | 65 0 |

ක. සිවලිංගම්,
සභාපති,
වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව.

2013 නොවැම්බර් මස 25 වැනි දින,
වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව,
නේරියකුලම් වීදිය,
නෙලුක්කුලම්,
වවුනියාව.

01-125/6

---

## බදුල්ල මහ නගර සභාව

2014 වර්ෂය සඳහා ආදාහනාගාර ගාස්තු හා ගලී රථ සේවාව සැපයීම සම්බන්ධ ගාස්තු අය කිරීම

2014 වර්ෂයට අදාළව ගාස්තු ප්‍රමාණ පහත දැක්වෙන උපලේඛනයට අනුකූලව අයකළ යුතුය යන මුදල් සංස්ථාපිත කටයුතු හා නීති පිළිබඳ ස්ථාවර කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව 2013 වර්ෂයේ පැවති මාසික සභා රැස්වීමේ දී තීරණ අංක 06 යටතේ සභා සම්මත වූ බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

### උපලේඛනය

ආදාහනාගාරය සඳහා ගාස්තු :

| | *රු. ශ.* |
|---|---|
| නගර සීමාව තුළ | 6,000 0 |
| නගර සීමාව තුළ (රාත්‍රී 7.00) | 6,500 0 |
| නගර සීමාවෙන් පිටත | 8,000 0 |
| නගර සීමාවෙන් පිටත (රාත්‍රී 7.00) | 8,500 0 |

ගලී රථ සේවා සඳහා ගාස්තු :

| | *රු. ශ.* |
|---|---|
| නගර සීමාව තුළ (ගෘහස්ථ) | 2,570.40 |
| අමතර ලෝඩ් එකක් සඳහා | 2,313.36 |
| නගර සීමාවෙන් පිටත (ගෘහස්ථ) | 5,140 0 |

| | |
|---|---|
| නගර සීමාව තුළ හා පිටත (රාජ්‍ය හා ආයතන හා | *රු. ශ.* |
| පෞද්ගලික ආයතන) | 5,712 0 |
| රජයේ නිල නිවස | 4,569 0 |

උපාලි නිශ්ශංක ගුණසේකර,
නගරාධිපති.

2013 නොවැම්බර් මස 29 වැනි දින,
බදුල්ල මහ නගර සභා කාර්යාලයේ දී ය.

01-01

## තිහගොඩ ප්‍රාදේශීය සභාව

අක්කර බදු අය කිරීම - 2014

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වැනි වගන්තිය ප්‍රකාර, තිහගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ස්ථිර හා නිතිපතා ගොවිතැන් යටතේ වූ ද (ගොඩ ඉඩම්) හෙක්ටයාර් 01 ක් හෝ ඊට වැඩි ඉඩම්වලින් පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන්ගෙන් යුතු අක්කර බද්දක් 2014 වර්ෂයට පනවා 2014 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 වැනි දායින් අවසන් වන අයුරු කාර්තු 04 න් අය කර ගැනීමටත් මෙම පනතේ 134 (7) වැනි වගන්තිය ප්‍රකාර එකී වාර්ෂික බදු මුදල් 2014 ජනවාරි 31 වැනි දිනට පෙර සම්පූර්ණයෙන් ගෙවනු ලැබුවහොත් එම මුදලින් 10% වට්ටමක් හා බදු මුදල කාර්තු වශයෙන් කාර්තුවේ පළමු මාසය තුළ ගෙවන්නේ නම් කාර්තුවේ සඳහන් මුදලින් 5% ක වට්ටමක් ලබාදිය යුතු බව සුදුසු යැයි තිහගොඩ ප්‍රාදේශීය සභාවේ 2013.11.29 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේ දී අංක 5, IV යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### උපලේඛනය

| | | *රු. ශ.* |
|---|---|---|
| 01. | හෙක්ටයාර් 01කට නොඅඩු හෙක්ටයාර් 05 අඩු | 50 0 |
| 02. | හෙක්ටයාර් 05 ක් හෝ ඊට වැඩි සෑම හෙක්ටයාර් එකකටම | 10 0 |

නිර්මාල් සමරසිංහ,
සභාපති,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2013 නොවැම්බර් මස 20 වැනි දින,
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-08

---

## වවුනියාව නගර සභාව

ගැසට් නිවේදනය - 2014

### යෝජනාව

වවුනියාව නගර සභා ආඥාපනතේ 255 වගන්තිය ප්‍රකාරව 2014 වර්ෂයේ *ගැසට් පත්‍රයේ* පළකිරීම පිළිබඳව 2013.09.17 වැනි දින ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු විශ්ලේෂණ කිරීමේ රැස්වීමේ දී පරීක්ෂාකොට පහත සඳහන් පරිදි ගාස්තුව සංශෝධනය කරන ලදී. අයදුම් පත්‍රයට අදාළ ගාස්තු, පුස්තකාල ගාස්තු, මස් මැරීමේ ගාස්තු, කුලී ගාස්තු, සෞඛ්‍ය සේවයට අදාළ ගාස්තු සහ වාහනවලින් සපයනු ලබන සේවාවලට අදාළ ගාස්තුව ඇතුලත් ගාස්තු සහ සාමාන්‍ය වශයෙන් වූ යෝජනා 03 ද පරීක්ෂා කොට පිළිවෙලට යෝජනා අංක 06, 07, 08, 09 10 සහ 11 යානාදියේ දී තීරණය කරන ලදී.

මෙම ගාස්තු සියල්ලම 2014.01.01 වැනි දින සිට අයකරනු ලැබේ.

මෙම ගාස්තු සියල්ලම වටිනාකම ඇතුළත් කරන ලද බදු සහ ජාතිය ගොඩනැගීමේ බදුවලින් රහිත ය.

*යෝජනා අංක 07*

නගර සභාව විසින් අයකරනු ලබන පහත සඳහන් අයදුම්පත්‍රයට අදාළ ගාස්තු, පුස්තකාල ගාස්තු, මස් මැරීමේ ගාස්තු, සහ කුලී ගාස්තු

ඇතුලත් ගාස්තුව සියල්ලම 2014.01.01 වන දින සිට නගර සභාව විසින් අයකරනු ලැබේ.

මෙම ගාස්තු සියල්ලම වටිනා ඇතුළත් කරන ලද බදු සහ ජාතිය ගොඩනැගීමේ බදුවලින් රහිතය.

(i) වර්ෂයකට ත්‍රීරෝද රථ ලියාපදිංචි කිරීමට අදාළ ගාස්තුව 300 0
(ii) වර්ෂයකට සවිබල කිරීමට අදාළ ගාස්තුව 200 0
(iii) වරිපනම් ලේඛණයේ නම වෙනස් කිරීම සඳහා අයදුම්පත්‍රයට අදාළ ගාස්තුව 250 0
(iv) ගොඩනැගිලි සඳහා අවසරය ලබා ගැනීමට අදාළ අයදුම්පත් ගාස්තුව 400 0
(v) ඉඩම් බෙදීමට අදාළ අයදුම්පත් ගාස්තුව 400 0
(vi) පදිංචිවීමේ සහතිකය ලබා ගැනීමට අදාළ අයදුම්පත් ගාස්තුව 200 0
(vii) දේපළ සඳහා මායිම් සහතික නිකුත් කිරීමට අදාළ ගාස්තුව 500 0
(viii) වෛද්‍ය පරීක්ෂණය අදාළ අයදුම්පත් ගාස්තුව 150 0
(ix) වසරකට දේපළ ලියාපදිංචි සහතික කිරීමට අදාළ ගාස්තුව 200 0
(x) වරිපනම් නම් වෙනස් කිරීම ගොඩනැගිලි සහ ඉඩම් බෙදීම පිළිබඳ අයදුම්පත් පරීක්ෂා කිරීමට අදාළ ගාස්තුව 300 0
(xi) මස් මැරීමේ ගාස්තුව
එක් එළුවෙකුට (අයදුම්පත් ගාස්තු රු. 50 සහිතව) 55 0
(xii) ගවයෙකුට (අයදුම්පත් ගාස්තු රු. 100 සහිතව) 105 0
(xiii) නලය මගින් ජලය ලබා ගැනීමේදී මාර්ගයේ වළවල් ඇතිවන අවස්ථාවේ දී එය අලුත්වැඩියා කිරීමට අදාල ගාස්තුව
*(අ)* බොරලු පස් සහිත මාර්ගය සඳහා මීටරයකට 700 0
*(ආ)* තාර පාර මීටරයකට 3,500 0
*(ඇ)* කොන්ක්‍රීට් වලින් ඉදිකරන ලද මාර්ගය මීටරයකට 4,500 0
(xiv) වැඩ අංශයෙන් නිකුත්කරනු ලබන ටෙන්ඩර් පත් සඳහා ගාස්තුව 1,500 0
(xv) ආදායම් අංශයෙන් නිකුත්කරනු ලබන බදු ටෙන්ඩර් පත් සඳහා ගාස්තුව 3,000 0
(xvi) වැඩිහිටියන් සඳහා පුස්තකාල සාමාජික ගාස්තුව 100 0
(xvii) කුඩා ළමයින් සඳහා පුස්තකාල සාමාජික ගාස්තුව 50 0
(xviii) වැඩිහිටියන් සඳහා පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීමට අදාල ගාස්තුව 50 0
(xix) ළමයින් සඳහා පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීමට අදාළ ගාස්තුව 25 0
(xx) දැන්වීම්වලට අදාළ ගාස්තුව - ඝන අඩියකට
*(අ)* පුද්ගලික ඉඩම්වල ඉදිකරනු ලබන දැන්වීම් 100 0
*(ආ)* පුද්ගලික ඉඩම්වල ඉදිකරනු ලබන දිලිසෙන දැන්වීම් 150 0
*(ඇ)* ප්‍රධාන මාර්ගයට පෙනෙන පරිදි ප්‍රධාන මාර්ගයට අසලින් ඉදිකරනු ලබන දැන්වීම් 100 0
*(ඈ)* ප්‍රධාන මාර්ගයට පෙනෙන පරිදි ප්‍රධාන මාර්ගයට අසලින් ඉදිකරුනු ලබන දිලිසෙනු ලබන දැන්වීම් 150 0
*(ඉ)* පළාත් පාලන සංකීර්ණය තුළ ඉදිකරනු ලබන දැන්වීම් 200 0
*(ඊ)* පළාත් පාලන සංකීර්ණය තුල ඉදිකරනු ලබන දිලිසෙනු ලබන දැන්වීම් 250 0
*(එ)* ඉදිකිරීමට තිබෙන ඉඩමට අදාල ගාස්තුව 50 0
*(ඒ)* පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දැන්වීම් පුවරුව උපයෝගිකොට ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් 100 0
(ඓ) පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දැන්වීම් පුවරුව උපයෝගි කොට ප්‍රදර්ශනය කරනු ලබන දිලිසෙනු ලබන දැන්වීම 150 0
(ඔ) පළාත් පාලන දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ තිබෙන දැවන්න දැන්වීම් (අතිරේක ගාස්තුව) 150 0

(xxi) එක් දිනකට සංස්කෘතික ශාලාව සඳහා අයකරනු ලබන කුලි ගාස්තුව 30,000 0
(xxii) සංස්කෘතික ශාලාව උපයෝගි කිරීම සඳහා තැන්පත් කළ යුතු මුදල් 20,000 0
(xxiii) පැය 2ට සංස්කෘතික ශාලාව උපයෝගි කිරීමට අදාළ ගාස්තුව 7,000 0
(xxiv) පැය 2ට වැඩියෙන් සංස්කෘතික ශාලාව උපයෝගි කරනු ලබන අවස්ථාවේ පැය සඳහා ගෙවිය යුතු කුලි ගාස්තු 2,500 0
(xxv) රජයේ දෙපාර්තමේන්තු සහ රජයේ දෙපාර්තමේන්තුවට අදාල අධ්‍යාපන සහ සංස්කෘතික උත්සවය පැවත්වීම සඳහා එක් දිනකට සංස්කෘතික ශාලාව සඳහා අයකරනු ලබන කුලී ගාස්තුව 15,000
(xxvi) රජයේ දෙපාර්තමේන්තු සහ රජයේ දෙපාර්තමේන්තුවට අදාල අධ්‍යාපන සහ සංස්කෘතික උත්සව සංස්කෘතික ශාලාවේ පැවැත්වීම සඳහා තැන්පත් කළ යුතු මුදල් 10,000 0
(xxvii) රජයේ දෙපාර්තමේන්තු සහ රජයේ දෙපාර්තමේන්තුවට අදාල අධ්‍යාපන සහ සංස්කෘතික උත්සව සංස්කෘතික ශාලාවේ පැවැත්වීම සඳහා පැය 02ට නොඅඩු කාලය සඳහා අයකරනු ලබන කුලී ගාස්තුව 5,000 0
(xxviii) රජයේ දෙපාර්තමේන්තු සහ රජයේ දෙපාර්තමේන්තුවට අදාල අධ්‍යාපන සහ සංස්කෘතික උත්සවය සංස්කෘතික ශාලාවේ පැවැත්වීම සඳහා සංස්කෘතික ශාලාව පැය දෙකට වැඩියෙන් උපයෝග කරනු ලබන අවස්ථාවේ දී පැයකට අයකරනු ලබන කුලී ගාස්තුව 2,000 0
(xxix) සභාවේ නිලධාරීන් සහ සේවකයින්ගේ පුද්ගලික උත්සවය සංස්කෘතික ශාලාවේ දී පැවැත්වනු ලබන අවස්ථාවේ දී එක් දිනකට අයකරනු ලබන කුලි ගාස්තුව 15,000 0
(xxx) නගර සභා ශාලාව සඳහා එක් දිනකට අයකරනු ලබන ගාස්තුව 8,500 0
(xxxi) නගර සභා ශාලාව උපයෝගි කිරීම සඳහා තැන්පත් කළ යුතු මුදල් 5,000 0
(xxxii) නගර සභා ශාලාව වෙනුවෙන් පැයකට අයකරනු ලබන කුලී ගාස්තුව 1,500 0
(xxxiii) පැයකට වැඩි කාලය සඳහා ශාලාව වෙනුවෙන් අයකරනු ලබන ගාස්තුව 1,000 0
(xxxiv) රජයේ දෙපාර්තමේන්තු සහ රජයේ දෙපාර්තමේන්තුවට අදාල සංස්කෘතික උත්සවය නගර සභා ශාලාවේ පැවැත්වීම සඳහා එක් දිනකට අයකරනු ලබන ගාස්තුව 4,250 0
(xxxv) නිදැල්ලේ ඇවිදින ගවයින්
*(අ)* නිදැල්ලේ යන ගවයන් අත්අඩංගුවට ගැනීමට අදාල ගාස්තුව 600 0
*(ආ)* ලඝුව 200 0
*(ඇ)* දඩය 1,000 0
*(ඈ)* එක් දින නඩත්තු මුදල 300 0
(xxxvi) සභාවේ පිට්ටනිය භාවිතා කිරීම
*(අ)* එක් දිනකට සභාවේ පිට්ටනිය භාවිතා කිරීමට අදාල කුලී ගාස්තුව 1,500 0
*(ආ)* සභාවේ පිට්ටනිය භාවිතා කිරීමට අදාල තැන්පත් මුදල් 2,500 0

(ඇ) සභාවේ පිට්ටනිය පිරිසිදු කිරීමට අදාල ගාස්තුව 2,000 0
(ඈ) එක් දිනකට පිට්ටනියේ ඇති වේදිකාව උපයෝගි කිරීමට අදාල කුලී ගාස්තුව 3,500 0

(xxxvii) පුස්තකාල ග්‍රන්ථ බැහැරකරනු ලබන අංශයේ ආපසු ග්‍රන්ථ භාරදීමේ දී සිදුවන ප්‍රමාදවීම සඳහා එක් දිනකට අයකරනු ලබන දඩය 3 00

(xxxviii) පාපැදි හිමිකම් පෑම පිළිබඳව එක් වසරකට අයකරනු ලබන ගාස්තුව (ලේබන ගාස්තු රු. 10 සහිතව 15 0

(xxxix) පාපැදි නවතා තැබීම සඳහා එක් දිනකට අයකරනු ලබන කුලී ගාස්තුව 10 0

(xl) යතුරුපැදිය නවත්වා තැබීම සඳහා එක් දිනකට අයකරනු ලබක කුලි ගාස්තුව 20 0

(xli) සභාවට අදාළ වෛරවපුලියන්කුලම ළමා උද්‍යානය කලෙයිමගල් ප්‍රජා ශාලාව තේක්කවත්ත ක්‍රීඩා පිටිය කෝවිල් කුලම ළමා උද්‍යානය පුන්තොට්ටම් ප්‍රජා ශාලාව සහ ක්‍රීඩා පිටිය යන ස්ථානවල උත්සව පැවැත්වීමේදී එක් දිනට අයකරනු ලබන කුලි ගාස්තුව 1000 0

(xlii) පුස්තකාල - උද්‍යානයේ විඩියෝ ගැනීම සඳහා අයකරනු ලබන ගාස්තුව 600 0

(xliii) නගර සභා සීමා තුළ ප්‍රසිද්ධ ස්ථානයේදී නතර කරනු ලබන රජයේ වාහනවල රජයේ ගමනා ගමන සේවා වාහනවල යතුරුපැදි හා පාපැදි හැර අනෙකුත් වාහන සඳහා පමණයි (වාහනයක් සඳහා ගාස්තුව) 28 50

(xliv) ගාස්තු සහිත නාන කාමරයේ දිය නෑම සඳහා එක් ටැංකියක් උපයෝගි කිරීම සඳහා පමණයි (වැසිකිලිය උපයෝගි කරනු ලබන්නේ නම් ඒ සඳහා ගාස්තුව අයකළ නොහැකිය) 25 0

(xlv) ගාස්තු සහිත නාන කාමරයේ වැසිකිලය පමණක් උපයෝගී කිරීම සඳහා 10 0

(xlvi) බස් නැවතුම්පොළේ ඉදිකර තිබෙන ගාස්තු සහිත වැසිකිලිය - එක් වතාවකට මුත්‍රා පිටකිරීම සඳහා 5 0

(xlvii) බස් නැවතුම්පොලේ ඉදිකර තිබෙන ගාස්තු සහිත වැසිකිලිය - එක් වතාවකට මළපහ කිරීම සඳහා 10 0

(xlviii) විවෘත වෙළඳ මධ්‍යස්ථානය මගින් අයකිරීම් සිදු කිරීමේදී එළවලු තොග විකිණීම, ව්‍යාපාර ස්ථානය වෙළඳපොල වටරවුම් පාරේ සතොසට අසලින් තිබෙන එළවලු වෙළඳ පොළ සහ කුඩිරුප්පුව මාර්ගයේ තිබෙන තාවකාලික වෙළඳපොළ සඳහා එක් දිනකට පමණක් 50 0

(xlix) නගර සභාව ඉදිරියෙන් පිහිටා තිබෙන පදික වෙළෙඳ ව්‍යාපාර ස්ථානය සඳහා එක් දිනකට පමණක් 60 0

(xlx) නගර සභා ක්‍රීඩා පිටියේ ඇති බැඩ්මිටන් පිටිය එක් දිනකට භාවිතා කිරීමට අදාළ කුලී ගාස්තුව රු. 2,000

(xlxi) නගර සභා ක්‍රීඩා පිටියේ ඇති බැඩ්මිටන් පිටිය පැය දෙකකට භාවිතා කිරීමට අදාළ කුලී ගාස්තුව 800 0

(xlxii) නගර සභා ක්‍රීඩා පිටියේ ඇති බැඩ්මිටන් පිටිය අමතරව භාවිතා කරන එක් එක් පැය සඳහා අදාළ කුලී ගාස්තුව 300 0

(xlxiii) නගර සභා ක්‍රීඩා පිටියේ ඇති බැඩ්මිටන් භාවිතා කිරීම සඳහා තැන්පත් කළයුතු මුදල් 2,000 0

(xlxiv) පුන්තෝට්ටම් සුසාන භූමියේ මිය ගිය එක් 2,000 0
අයෙකුගේ දේහයක් විදුලි බලයෙන් හා ගෑස් මගින් ආදාහනය කිරීම සඳහා ගාස්තුව 10000 0

(xlxv) පුන්තෝට්ටම් සුසාන භූමියේ එක් ශාලාවක මිය ගිය එක් අයෙකුගේ දේහයකට අවසන් කටයුතු සිදු කිරීම සඳහා අදාළ ගාස්තුව 2,000 0

(xlxvi) ට්‍රැක්ටර් රථය සමග වතුර ලීටර් 3000 ක පරිමාණයෙන් යුතු බවුසරයක් කුලී පදනම මත පෞද්ගලික හෝ කාර්යාලයක ප්‍රයෝජනය සඳහා භාවිතා කිරීමේ දී එක් දිනකට අදාළ ගාස්තුව (පැය 8කට) 5,000 0

(xxxix) පාපැදි නවත්වා තැබීම සඳහා එක් දිනකට අයකරනු ලබන කුලී ගාස්තුව

(i) නගර සභා සීමාවෙන් පිටතට රැගෙන යාමේ දී අමතර ගාස්තු වශයෙන් කි. මි. 1ක් සඳහා රු. 60 0

(ii) වතුර ලීටර් 3000ක ප්‍රමාණයෙන් යුත් බවුසරය පමණක් පෞද්ගලික හෝ කාර්යාල ප්‍රයෝජනය සඳහා එක් දිනකට (පැය 8කට) ගාස්තුව රු. 1,300 0

නගර සභා සීමාවෙන් පිටතට රැගෙ යාමේදී අමතර කි. මි. 1ක් සඳහා ගාස්තුව රු. 60 0 බැගින් අය කරනු ලැබේ.

(iii) වාහනයක් බැගින් වතුර ලීටර් 3000ක් පෞද්ගලික හෝ කාර්යාලයන් සඳහා ලබා දීමේ දී එක් බවුසරයකින් වතුර (ලීටර් 3000) ක් ලබා දීම සඳහා ගාස්තු රු. 1,200 0

නගර සභා සීමාවෙන් පිටතට රැගෙන යාමේදී අමතර කි. මී. 1ක් සඳහා රු. 60.00 ක් බැගින් අයකරනු ලැබේ.

## 08 වැනි යෝජනාව

වවුනියාව නගර සභාව විසින් කරනු ලබන අපද්‍රව්‍ය ඉවත් කිරීමේ වැඩ පිළිවලට අදාල

ගාස්තු පහත සඳහන් පරිදි තීරණය කර ඇත. (නගර සභා නිලධාරින් හා සේවකයන්ගෙන් පහත සඳහන් ගාස්තුවෙන් භාගයක් අය කරනු ලැබේ.)

ගාස්තු සියල්ලම වටිනා සහිත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු රහිතය.

(i) වැසිකිලි වළවල් සුද්ද කිරීම සඳහා අයකරනු ලබන ගාස්තුව

| *ප්‍රමාණය* | *නගර සභා සීමාව තුළ* | *ප්‍රාදේශීය සභා සීමාව තුළ හෝ රාජ්‍ය නොවන ආයතන සඳහා* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| (අ) ලී 4500 | 3,500 | 5,250 |
| (ආ) ලී 4000 | 3,000 | 4,600 |
| (ඇ) ලී 3000 | 2,500 | 3,500 |

(ii) අපවිත්‍ර ජලය ඉවත් කිරීම සඳහා අයකරනු ලබන ගාස්තුව

| *ප්‍රමාණය* | *නගර සභා සීමාව තුළ* | *ප්‍රාදේශීය සභා සීමාව තුළ හෝ රාජ්‍ය නොවන ආයතන සඳහා* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| (අ) ලී 4500 | 2500 0 | 4,000 0 |
| (ආ) ලී 4000 | 2250 | 3,500 0 |
| (ඇ) ලී 3000 | 1,750 | 2,750 0 |

(iii) අතිරේක වශයෙන් කුණු ද්‍රව්‍ය ඉවත් කිරීම

කුණු ද්‍රව්‍ය ඉවත්කිරීම සඳහා එක් ට්‍රැක්ටර් පෙට්ටියකට අයකරනු ලබන ගාස්තුව රු. 1,500 වේ.
නගර සභාවේ සිට කි. මී. 5ට ඇතුලත් සීමාව සඳහා මෙම ගාස්තුව අදාල වේ. කි. මී. 5 වැඩි එක් කි. මී. සඳහා රු. 110 බැගින් ගාස්තු අයකරනු ලැබේ.

(iv) මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් සිදුකරනු ලබන පරීක්ෂණවලට අදාල ගාස්තුව රු. 250

09 වැනි යෝජනාව

වවුනියාව නගර සභාවට හිමි වාහන පොදු ප්‍රායෝජනය සඳහා කුලී පදනම මත නිකුත් කිරීම

මෙම ගාස්තු සියල්ලම 2014.01.01 වන දින සිට අයකරනු ලැබේ. තවද ගාස්තු වටිනා සහිත සහ ජාතිය ගොඩනැගීමේ බදු රහිතය.

1. බස් රථය - කිලෝමීටරයකට

සභාවේ නිලධාරීන් සහ සේවකයින්ගේ ප්‍රයෝජනය සඳහා වරප්‍රසාදය සහිත ගාස්තුව රු. 35 0

2. බස් රථය කිලෝමීටරයකට අනෙකුත් දෙපාර්තමේන්තු සහ මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා ගාස්තුව රු. 50 0

3. මාර්ගසකස් කිරීමේ ගල් රෝලය - කුලී පදනම මත උපයෝගි කිරීම
එක් දිනකට (පැය 06කට) රු. 10,920 0

4. කුඩා ප්‍රමාණයේ ගල් රෝලය - කුලී පදනම මත උපයෝගී කිරීම රු. 2,700
එක් දිනකට (පැය 06 කට) රු. 2,700

5. භාණ්ඩ බැහැරකිරීම් සහ පස් කැණීම් කටයුතුවල යෙදීම සඳහා වාහන (Wheel Loader, Bakhoe) උපයෝගිකිරීම සඳහා කුලියට ලබා දීම
- පැයකට රු. 4,000 0

10 වැනි යෝජනාව

*පොදු යෝජනා*

ගාස්තු සියල්ලම වටිනා සහිත බදු ජාතිය ගොඩනැගීමේ බදු රහිතය

(4) (i) 2014.01.01 වසර සිට අපගේ සභාව යටතේ ක්‍රියාත්මක වන එළවලු වෙළෙඳපොල සිට මීටර් 500 තුළ පුද්ගලික අය විසින් එළවලු විකිණීම සපුරා තහනම් කර ඇත.

(ii) 2014.01.01 වන දින සිට නගර සභා සීමාව තුළ ඉදිකර තිබෙන දුරකථන කනු සඳහා ගාස්තුව අයකිරීම් පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කරනු ලැබේ.

1. මී 20ට වැඩි උස ඇති කනුව සඳහා වසරකට රු. 3,000 0
2. මී 20ට අඩු උස ඇති කනු සඳහා වසරකට රු. 2,000 0

(iii) 2014.01.01 වන දින සිට නගර සභා සීමා තුළ කුකුලු මස් කිරීමේදී නගර සභාවේ අවසරය ලබා ගත යුතුය. තවද මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් සෞඛ්‍ය ක්‍රියාපරිපාටිවලට අනුකූලව නිර්දේශ කරන ලද ප්‍රසිද්ධ ස්ථානයේ දී කුකුළන් මස් කිරීමේ කටයුතුවල යෙදිය හැකිය. කුකුලු මස් ශීතකරන ලද පෙට්ටියේ නගර සභාව විසින් අනුමත කරන ලද ස්ථානවල දී විකිණිය හැකිය.

නගර සභාව විසින් අවසර දෙන ලද අයට පමණක් මෙවැනි කටයුතුවල යෙදිය හැකිය. මෙම රැකියාවේ යෙදීම සඳහා අයකරනු ලබන ගාස්තුව පහත සඳහන් වේ.

1. වෙළෙඳපොළ සහිත මස් කඩ හෝ ආහාර ගබඩාවේ මස් විකිණීම සඳහා එක් වසරකට අයකරනු ලබන ගාස්තුව රු. 40,000

මීට අදාළ අවසර පත්‍රය වර්ෂයේ මුල් අවස්ථාවේ දීම ලබා ගත යුතුය.

2. මස් කඩය පමණක් පවත්වාගෙන යන අය සඳහා වර්ෂයකට ගෙවිය යුතු ගාස්තුව රු. 25,000 මීට අදාළ අවසර පත්‍රය වර්ෂයේ මුල් අවස්ථාවේ දීම ලබාගත යුතුය.

කේසත්‍යසීලන්,
ලේකම්,
නගර සභාව,
වවුනියාව.

01-204/4

---

අඹගමුව ප්‍රාදේශීය සභාව

2014 වර්ෂය සඳහා වරිපනම් බද්ද

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය යටතේ අඹගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් දියුණු ගම් ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කර දැනට වරිපනම් බදු අය කරනු ලබන නගරයන් හි පිහිටි සියළුම ඉඩම් හා ගොඩනැගිලිවල වාර්ෂික වටිනාකම මත පහත උපලේඛනයේ එකී නගරයන් ඉදිරියෙන් දක්වා ඇති ප්‍රතිශතයන් පරිදි වරිපනම් බද්දක් 2013 වර්ෂය සඳහා පනවා අය කරනු ලැබේ.

එකී පනතේ 137(7) වගන්තිය යටතේ පහත සඳහන් පරිදි වට්ටම් ප්‍රදානය කරනු ලැබේ.

1. සම්පූර්ණ බදු මුදල ජනවාරි 31 දිනට පෙර ගෙවීමේදී සියයට දහයක් (10%) ;
2. බදු මුදල කොටස් වශයෙන් ගෙවීමේදී අදාළ කාර්තුවේ මුල් මාසය තුළ ගෙවීමේදී සියයට පහක් (5%),
අදාළ කාර්තුව තුළදී බදු මුදල නොගෙවන පුද්ගලයින්ගෙන්,

1. සෑම ව්‍යාපාරික ස්ථානයක් සඳහාම සියයට විස්සක් (20%) ;
2. අනෙකුත් සෑම ස්ථානයක් සඳහාම සියයට පහළොවක් (15%),

වශයෙන් වරෙන්තු ගාස්තුවක් අය කෙරෙන බව ද දැනුම් දෙමි.

එම්. එස්. වෙල්ලයන් දිනේෂ්,
සභාපති,
අඹගමුව ප්‍රාදේශීය සභාව.

2013 දෙසැම්බර් මස 10 වැනි දින,
අඹගමුව ප්‍රාදේශීය සභාව,
ගිනිගත්හේන.

උපලේඛනය

| *නගරය* | *ප්‍රතිශතය (2014)* |
|---|---|
| බගවන්තලාව | 13% |
| වටවල | 13% |
| ගිනිගත්හේන | 13% |
| මස්කෙළිය | 13% |
| ටින්සින් | 12% |
| නෝර්වුඩ් | 12% |
| සාමිමලේ | 12% |
| නෝටන් බ්‍රිජ් | 12% |
| අයර්බි | 10% |
| හොන්සි | 10% |

01-157/1

**හොරව්පොතාන ප්‍රාදේශීය සභාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 148 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර සාමාන්‍යයෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ සෑම වාහනයක් සහ සතෙක් වෙනුවෙන්ම මෙහි උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ වාර්ෂික බද්දක් 2014 වර්ෂයේ දී පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි."

*උපලේඛනය*

| | රු. ශත |
|---|---|
| මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා ම | 25 0 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් හෝ කරත්තයක් සඳහා- | |
| (අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේනම් | 18 0 |
| (ආ) වෙළෙඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| කරත්තයක් සඳහා | 20 0 |
| අත් කරත්තයක් සඳහා | 7 0 |
| සෑම රික්ෂෝවක් සඳහාම | 10 0 |
| සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | 15 0 |
| සෑම ඇතෙකු සඳහා ම | 50 0 |

01-16/5

**හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව**

2014 වර්ෂයට වරිපනම් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තිය හා 146 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2013 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අනුර වික්‍රමසිංහ,
සභාපති,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 29 වැනි දින,
හොරොව්පොතාන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**01. යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) උපවගන්තියෙන් හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව විසින් දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද සෑම ප්‍රදේශයකම පිහිටි සෑම නිශ්චල දේපළක 1994 වර්ෂයේ වාර්ෂික වටිනාකම 2014 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගත යුතු යැයි යෝජනා කරමි.

**02. යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උපවගන්තිය සහ 6 වැනි උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව විසින් දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමින් සියයට 6%ක අනුප්‍රමාණය අනුව වූ වරිපනමක් 2013 වර්ෂය සඳහා පනවා අයකර ගත යුතු යැයි ද වාර්ෂික වරිපනම් මුදල 2014 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දින වලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයිද යෝජනා කරමි.

01-16/4

---

**කටුවන ප්‍රාදේශීය සභාව**

2014 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

කටුවන ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 7/8 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2014 ඔක්තෝබර් මස 17 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නාවූ කිසියම් ව්‍යාපාරයක් කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2014 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්ද 2014 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර කටුවන ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.".

*උපලේඛනය*

| | *I වැනි තීරුව*<br>*බද්ද අදාල වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය* | *II වැනි තීරුව*<br>*ගෙවිය යුතු බද්ද*<br>*රු. ශ.ත* |
|---|---|---|
| 1. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. | රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| 3. | රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක | 180 0 |
| 4. | රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක | 360 0 |
| 5. | රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක | 1,200 0 |
| 6. | රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

01-09/2

## කටුවන ප්‍රාදේශීය සභාව

2014 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බද්ද පැනවීම

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ හතරවැනි උපලේඛනයේ විධිවිධාන වලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2014 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2014 වර්ෂය සඳහා පනවා අය කිරීමට කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2013 මස ඔක්තෝබර් මස 17 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### *උපලේඛනය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|
| 01. (i) මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, බයිසිකලයක්, කරත්තයක් ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| (ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා | |
| *(අ)* වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| *(ආ)* වෙළඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| (iii) සෑම කරත්තයක් සඳහා | 20 0 |
| (iv) සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| (v) සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| (vi) සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| (vii) සෑම ඇතෙකු සඳහා | 50 0 |

02. විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ හුදෙක් පුද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සඳහා සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත පමණක් ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

01-09/8

---

## කටුවන ප්‍රාදේශීය සභාව

ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත

(176 වැනි අධිකාරය) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තු කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2014 වර්ෂයට පහත පරිදි පනවනු ලබන බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2013 මස ඔක්තෝබර් මස 17 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | | *රු. ශ.* |
|---|---|---|
| 1. | තාවකාලික චිත්‍රපට දර්ශන, සර්කස් දර්ශන, මැජික් සංදර්ශන, නාට්‍ය සංදර්ශන හෝ වෙනත් යම් සංදර්ශනයක් සඳහා | |
| | එක් දිනකට බලපත්‍ර ගාස්තුව | 200 0 |
| | වැඩි වන සෑම දිනකටම | 100 0 |
| 2. | සංගීත සංදර්ශනය සඳහා එක් දිනකට | 500 0 |
| 3. | ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් සියයට දහයක (10%) විනෝද බද්ද | |

01-09/9

---

## කටුවන ප්‍රාදේශීය සභාව

අක්කර බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ –

*(අ)* හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරක්ම මත 2014 වර්ෂය සඳහා රුපියල් දහය බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

*(ආ)* ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධි විධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2014 මස ඔක්තෝබර් මස 17 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-09/3

## කටුවන ප්‍රාදේශීය සභාව

2014 වර්ෂය සඳහා පාරිසරික පනත යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම

2000 අංක 53 හා 1988 අංක 56 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව මධ්‍යම පරිසර අධිකාරිය මගින් මා වෙත පවරා ඇති බලතල අනුව කටුවන ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත ආරම්භ කර පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ සඳහන් ව්‍යාපාර, කර්මාන්ත සම්බන්ධයෙන් ඉහත කී පනතේ අදාළ සංශෝධන යටතේ පවරා ඇති රෙගුලාසිවලට අනුකූලව එකී ව්‍යාපාර, කර්මාන්ත පවත්වාගෙන යනු ලබන්නන් විසින් 2014 වර්ෂයට බලපත්‍රයක් ලබාගත යුතු වේ. ඒ සඳහා පහත දක්වා ඇති ගාස්තු ගෙවිය යුතු බව ද දන්වා සිටිමි.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2014 මස ඔක්තෝබර් මස 17 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*ව්‍යාපාර/කර්මාන්ත* :

| | *රු. ශත* |
|---|---|
| 01. අයදුම්පත් ගාස්තුව | 100 0 |
| 02. අයදුම්පත් අලුත් කිරීමේ ගාස්තු | 50 0 |

| *මූලික ආයෝජනය* | *පරීක්ෂණ ගාස්තු* |
|---|---|
| | *රු. ශත* |
| 1,00,000 දක්වා | 400.0 |
| 1,00,000 - 2,50,000 | 750.0 |
| 2,50,001 - 5,00,000 | 3,000.0 |
| 5,00,001 - 10,00,000 | 4,000.0 |
| 10,00,000න් ඉහළට | 8,000.0 |

| | |
|---|---|
| වර්ෂ තුනකින් නිකුත් කරන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව | 3,000.0 |

*පහත කර්මාන්ත සඳහා බලපත්‍ර ලබාගත යුතු වේ :—*

1. සේවක සංඛ්‍යාව 25ට අඩුවෙන් සේවයේ යොදවන සබන්, ක්ෂාලක ද්‍රව්‍ය හෝ වෙනත් පිරිසිදුකාරක ද්‍රව්‍ය නිෂ්පාදන කර්මාන්ත.
2. මෙට්‍රික් ටොන් 150ට අඩු ඒකාබද්ධ ධාරිතාවයක් සහිත පෙට්‍රෝලියම් ද්‍රව තොග ගබඩා.
3. දිනකට නිෂ්පාදන ධාරිතාවය කිලෝග්‍රෑම් 50ට වැඩි සහ 100ට අඩු දුම් ගැසූ දාර රබර් රොටි නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
4. යෙදවුම් ධාරිතාවය එක් නිෂ්පාදන ක්‍රියාවලියක් තුළ දී වරකට පොල්කටු 1,000ට වැඩි සහ 10,000ට අඩු පොල්කටු අඟුරු පිළිස්සීමේ කර්මාන්ත.
5. සේවකයන් 10ට වැඩි සහ 25ට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවන ආයුර්වේද, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීමේ හෝ නිස්සාරණය කිරීමේ හෝ සංයෝජනය කිරීමේ කර්මාන්ත.
6. රීයම් උණු කිරීම සිදු නොකරන මුද්‍රණාල.
7. සේවකයන් 10ට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවන බතික් කර්මාන්ත.
8. සේවකයන් 10ට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවන ෆයිබර් ග්ලාස් අමුද්‍රව්‍යයක් වශයෙන් භාවිතා කරන කර්මාන්ත.
9. සේවකයක් 10ට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවන කාබනික ද්‍රව්‍ය භාවිතයෙන් රෙදි වියලා පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය සහිත වාණිජ ලොන්ඩරි.
10. කාර්මික අපසන්දන ජනනය වන තෙත් ක්‍රියාවලි ඇතුළත් නොවන සම් නිමවුම් කිරීමේ කර්මාන්ත.
11. ස්වභාවික කෙඳි විරංජනය කිරීමේ හෝ වර්ණ ගැන්වීමේ කර්මාන්ත හැර කොහු මෝල්.
12. රෙදි විවීමේ යන්ත්‍ර 25ට අඩුවෙන් ඇති බලවේග පෙහෙකම්හල්.
13. රෙදි විවීමේ යන්ත්‍ර 10ට වැඩියෙන් ඇති අත්යන්ත්‍ර පෙහෙකම්හල්.
14. සීනි නිෂ්පාදනය කිරීමේ හෝ සීනි පිරිපහදු කිරීමේ කර්මාන්ත හැර උක් මෝල්.
15. සේවකයන් සංඛ්‍යාව 05ට වැඩියෙන් සහ 25ට අඩුවෙන් සේවය කරන එළවළු. පළතුරු, මස්, මුහුදු ආහාර සහ කිරි සැකසීමේ කර්මාන්ත.
16. සේවකයන් සංඛ්‍යාව 10 ඉක්මවන සහ 25 නොඉක්මවන පොල්තෙල් සිඳීමේ කර්මාන්ත.
17. සේවකයන් සංඛ්‍යාව 10ට වැඩියෙන් සහ 25ට අඩුවෙන් සේවයේ යොදවන බේකරි නිෂ්පාදන, බිස්කට්, රසකැවිලි නිෂ්පාදන සිදු කිරීමේ කර්මාන්ත.
18. සේවකයන් සංඛ්‍යාව 10ට වැඩියෙන් සහ 25ට අඩුවෙන් සේවයේ යොදවන මද්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
19. කෝස්ටික් සෝඩා භාවිතයෙන් බෝතල් සේදීමේ ක්‍රියාවලිය සහිත බෝතල්ගත කිරීමේ යන්ත්‍රාගාර හැර වෙනත් බෝතල්ගත කිරීමේ කර්මාන්ත.
20. වී පෙඟවීමේ ක්‍රියාවලිය සහිත හා දිනකට කි.ග්‍රෑ. 5,000 නොඉක්මවන නිෂ්පාදන ධාරිතාවයක් ඇති වී මෝල් .
21. වියළි ක්‍රියාවලිය සහිත වී මෝල් (වී පෙඟවීමේ ක්‍රියාවලිය රහිත).
22. ඇඹරුම් හල්.
23. පක්ෂීන් 50ට වැඩි සහ 2,500ට අඩු කුකුල් ගොවිපලවල්.
24. ඌරන් 5ට වැඩි සහ 50ට අඩු ඌරු ගොවිපලවල්.
25. සතුන් 10ට වැඩි සහ 50ට අඩු ගව, එළු ගොවිපලවල්.
26. දිනකට මෙට්‍රික් ටොන් 25ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත සත්ව ආහාර නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
27. ජල හෝ සූර්ය හෝ සුළං විදුලි උත්පාදන බලාගාර හැර ඒකාබද්ධ උත්පාදන ධාරිතාව කිලෝවොට්ස් 100ට වැඩි සහ 300ට අඩු විදුලිය නිෂ්පාදන කිරීමේ ඒකක.
28. දිනකට ඝන මීටර් 50ට අඩු ධාරිතාවයක් ඇති කොන්ක්‍රීට් පූර්ව මිශ්‍රණ යන්ත්‍රාගාර.
29. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත.
30. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
31. ඝන මීටර් 20ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් ඇති හුණු පෝරණු.
32. සේවකයින් 25ට අඩුවෙන් සේවයේ යොදවන පිඟන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
33. උළු සහ ගඩොල් කර්මාන්ත.
34. අත් මෙවලම් භාවිතා කරන මිනිස් ශ්‍රමය පමණක් යොදා ගන්නා කර්මාන්ත ඇතුළත් නොවන දිනකට ඝන මීටර් 25ට වඩා අඩු ඒකාබද්ධ නිෂ්පාදන ධාරිතාවයක් ඇති කළුගල් ඇඹරීමේ හෝ සැකසීමේ කර්මාන්ත.
35. යෙදවුම් ධාරිතාව දිනකට මෙට්‍රික් ටොන් 5ට අඩු දාහක පොහොර

36. බෝරෝන් පිරියම් කිරීමේ ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්තය.
37. මීටර් 50ට අඩු බහු කාර්ය එකලා විදුලි වඩු යන්ත්‍ර.
38. අශ්වබල 3 ධාරිතාවය ඉක්මවන විදුලියෙන් ක්‍රියාකරන යන්ත්‍ර යොදා ගන්නා වූ වඩු කර්මාන්ත ශාලා.
39. නේවාසික කාමර 2ට අඩු නේවාසික හෝටල්, ආගන්තුක ලැගුම්හල් හා තානායම්.
40. සේවකයන් 05ට හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යොදවන නේවාසික හෝටල්, ආපන ශාලා හා භෝජනාගාර.
41. සේවකයන් 25 ඉක්මවන හා 200 නොඉක්මවන සංඛ්‍යාවකට නේවාසික පහසුකම් සහිත නේවාසිකාගාරය.
42. එක් වැඩ මුරයක් සඳහා සේවකයන් 10ට වැඩි සහ 200 ට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවන ඇඟළුම් කර්මාන්ත.
43. වරකට එක් බෝර වලක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර් 600ක නිෂ්පාදන ධාරිතාවයට අඩු පිපිරවීම් සිදු කරන කැණීම් කටයුතු හෝ පුපුරන ද්‍රව්‍ය භාවිතා කරමින් වරකට එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන කැණීම් කටයුතු.
44. සේවක සංඛ්‍යාව 25ට අඩුවෙන් සේවයේ යොදවන ලෝහ සංස්කාරක කර්මාන්ත යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර ආයුධ, උපකරණ නිෂ්පාදනය කිරීමේ සහ එකලස් කිරීමේ (ලියවන පට්ටල්, වැල්ඩින් වැඩ පළවල් වැනි කර්මාන්තයන් ද ඇතුළත්ව).
45. (වාහන වායු සමීකරණ අලුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීමේ හා සවි කිරීමේ කටයුතු කරගෙන යාමේ පහසුකම් ඇතුළුව) වාහන අළුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු කරගෙන යන ගරාජ.

01-09/1

---

## කටුවන ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් බද්ද පැනවීම - 2014 වර්ෂය

කටුවන ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 7/8 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2013 ක් වූ ඔක්තෝබර් මස 17 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාර කටුවන ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් 2014 වර්ෂය සඳහා අය කිරීමට කටුවන ප්‍රාදේශීය සභාව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.".

***උපලේඛනය***

| | | රු.ශත |
|---|---|---|
| 1. | බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම (වර්ෂයකට) | 100 0 |
| 2. | බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට (මසකට) | 35 0 |

01-09/4

---

## කටුවන ප්‍රාදේශීය සභාව

2014 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 147 වැනි වගන්තිය යටතේ කටුවන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා කටුවන ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2014 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2014ක් වූ ඔක්තෝබර් මස 17 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

## උපලේඛනය

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| | *බලය දෙනු ලබන කාර්යය* | *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1. | උකස් ලියාපදිංචි කිරීම | 1,000 0 | 1,500 0 | 3.000 0 |
| 2. | ප්‍රසිද්ධ පිට්ටනි පාවිච්චියට ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | වීදිවල දේශන පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | අවහිර කිරීම සහ අයුතු ඇඳාගැනීම් | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | වාහන නතර කර තැබීම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | ලැගුම් නිවාස | 1,000 0 | 1,500 0 | 3.000 0 |
| 7. | අතු ගෙවල් සහ වැසිකිලි ඉදිකිරීම හා නඩත්තු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | ග්‍රැමෆෝන්, ශබ්දවාහිනී යන්ත්‍ර යනාදිය ක්‍රියා කරවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | හෝටල් | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | බේකරි | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | කිරි පට්ටි හා කිරි වෙළෙඳාම ආහාර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ආහාර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | මාළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | මස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | අයිස් කර්මාන්ත ශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | සිසිල්බීම කර්මාන්තශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | ලොන්ඩරි | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | සංචාරක වෙළෙන්දෝ | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | ගවගාල් | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | පක්ෂීන් සහ වෙනත් සතුන් හා මල් ආදිය විනාශ කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | සාතක මඩු | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | ජල සම්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | ළිං තැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | කොණ්ඩා සැකසීමේ සැලුන්හල් සහ බාබර් සාප්පු/බියුටි සෙන්ටර් | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | රටබීම හා බියර් අලෙවි ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | කොන්ක්‍රීට් වැඩපළක් පැවැත්වීම | | | |

*අන්තරායදායක ව්‍යාපාර* :

| | | | | |
|---|---|---|---|---|
| 1. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | වෙල්ඩින් වැඩපලක් හෝ ග්‍රිල් වැඩ පලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | බලවේග යන්ත්‍ර මගින් නූල් නිෂ්පාදනය, පුළුන් සකස් කිරීම හා රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | ස්ක්‍රීන් ප්‍රින්ටින් වැඩ පලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | කොන්ක්‍රීට් සිලින්ඩර් හෝ වෙනත් සිමෙන්ති භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | සිමෙන්ති, බ්ලොක් ගල්, මල් පෝච්චි, බීරලු නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ, පරිගණක යන්ත්‍ර, සෙලියුලර් දුරකථන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | මෝටර් කොයිල් එතීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | පොහොර වර්ග, කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම, සත්ව ආහාර වර්ග නිපදවීම, ගබඩාකර තැබීම හෝ විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ගල් වලක් හෝ අතින් ගල් කඩන ස්ථානයක් පවත්වාගෙන යාම | 750 0 | 1,500 0 | 3,000 0 |
| 11. | බෝට්ටු එන්ජින් අලුත්වැඩියා කිරීම් හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | වී පාහින මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | විදුලි බලයෙන් හෝ අත්යන්ත්‍ර මගින් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| | *බලය දෙනු ලබන කාර්යය* | *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 14. | ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර, කැමරා වීඩියෝ, ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | අතින් පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | ගල් ස්මාරක, සිහිවටන පුවරු සෑදීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | විදුලි උත්පාදක යන්ත්‍ර (ජෙනරේටර්) කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| | *අප්‍රසන්න ව්‍යාපාර* : | | | |
| 1. | කුල් ස්පොට් එකක් හෝ කිරි හලක් හෝ ස්නැක් බාර් එකක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | බිත්තර සිල්ලරට හෝ තොග විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | රස කැවිලි නිපදවීමේ, කේක් වර්ග නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | පපඩම් හෝ නූඩ්ල්ස් නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | අයිස් ක්‍රීම්, යෝගට්, බීම පැකට් නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | ජෑම්, සිරප්, සෝස් වර්ග නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | කරවල, ජාඩි වේලීම හෝ විකිණීම, ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | කුරුඳු තැලීම, කුරුඳු තෙල් මඩුවක් පැවැත්වීම හෝ කුරුඳු දර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | ඔසු පැන් හලක්, කොල කැඳ හෝ බැදපු කඩල, රටකජු (ටේස්ට් කඩල) විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | පානීය ජලය බෝතල්ගත කර ගබඩාකර තැබීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ගෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | කුකුළන් 1000ට අඩු කුකුල් කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 750 0 |
| 13. | කුකුළන් 1000ට වැඩි කුකුල් කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ඌරන් 25ට අඩු ඌරු කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 750 0 |
| 15. | ඌරන් 25ට වැඩි ඌරු කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | එළදෙනුන් 25ට අඩු ඇති කිරීමේ ස්ථාන පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 750 0 |
| 17. | එළදෙනුන් 25ට වැඩි ඇති කිරීමේ ස්ථාන පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| | *අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර* : | | | |
| 1. | මිරිස්, ධාන්‍ය වර්ග, පිටි ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | බැටරි චාර්ජ් කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | ෆයිබර් ග්ලාස් වැඩ පලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | කොහු මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | පොල් ලෙලි හා දැව පල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | හුණු වැරටි පිළිස්සීම සඳහා පෝරණුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | හම් වර්ග පදම් කරන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | හම් වර්ගවලින් හෝ රබර් වර්ගවලින් භාණ්ඩ නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | රබර් බුෂ් සාදන වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | රබර් දුම් ගෙයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ගිණිකෙළි භාණ්ඩ, රතිඤ්ඤා නිපදවීමේ හෝ විකිණීමේ, ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | වාහන ගෑස් කිරීමේ හෝ ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ගෑස් ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | රෙදි පින්තාරු කිරීම (බතික් වැඩ පලක්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ස්වර්ණාභරණ නිපදවීමේ හා අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | ස්වර්ණාභරණ පාට කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | මෙට්ට නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| | *බලය දෙනු ලබන කාර්යය* | *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 18. | සබන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ලෝහ භාණ්ඩ නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | පිත්තල භාණ්ඩ නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | ටයර්-ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | අලුත් හෝ පරණ ටයර් ටියුබ් ගබඩා කිරීම, කට්ටා කැපීම විකිණීම සඳහා ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | කොප්පරා නිෂ්පාදනය කිරීමේ, ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | අවමංගල සේවා සපයන ස්ථානයක් (මල් ශාලාවක්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | වාහන ගාල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | පොල්තෙල් හෝ වෙනත් තෙල් වර්ග නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

01-09/5

---

## කටුවන ප්‍රාදේශීය සභාව

2014 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

කටුවන ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 7/8 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 17 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කර ගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2014 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත් එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2014 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර කටුවන ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *බලය දෙනු ලබන කාර්යය* | *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1. | සම්භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | වඩු වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | ලී ඉරන මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| | *බලය දෙනු ලබන කාර්යය* | *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 4. | කළු ගල් වැඩපලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | ගඩොල් කර්මාන්ත ශාලාවක් | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | උළු කර්මාන්ත ශාලාවක් | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | වේවැල් භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | අශ්ව බල 10ට අඩු වී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | අශ්ව බල 10ට වැඩි වී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | පැඟිරි බොයිලරයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | කොහු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | මැටි භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | තේ කොළ ඇඹරීමේ කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | පිත්තල භාණ්ඩ කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | පොල් ලී මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | ඇඟළුම් කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | සබන් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | සුළු පර්මාණ යන්ත්‍ර සූත්‍ර නිපදවීමේ කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |

01-09/6

---

**කටුවන ප්‍රාදේශීය සභාව**

2014 වර්ෂය සඳහා පොළ බදු ගාස්තු පැනවීම

කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පොළවල් මගින් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් ව්‍යාපාර කටයුතු වෙනුවෙන් 2014 වර්ෂයේ ජනවාරි සිට 2014 දෙසැම්බර් දක්වා බදු අයකර ගැනීම සුදුසු බවට කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 17 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

***2014 වර්ෂය සඳහා යෝජිත නව පොළ බදු ක්‍රමය***

| *අනු. අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
|---|---|---|---|---|
| 1. | 8' x 8' කඩ කාමරයකින් | 100 0 | | |
| 2. | විවෘත කඩ බිම් 8' x 8' | 80 0 | | |
| 3. | රෙදි 8' x 8' විවෘත බිම් | 80 0 | | |
| 4. | මහා මාර්ගය දෙපස රෙදි | 60 0 | | |
| 5. | ලොතරැයි කුඩුවකින් | | 60 0 | |
| 6. | හාල් වෙළඳසල් | | 100 0 | |
| 7. | මනි බඩු විකුණන | | 50 0 | 40 0 |
| 8. | මාලු බයිසිකල් පෙට්ටියකින් | 250 0 | | |
| 9. | යකඩ බඩු, ආයුධ විකිණීම | 60 0 | 40 0 | |
| 10. | ඉරිඟු, පොරි විකිණීම | | 60 0 | |
| 11. | කෙසෙල් ගෙඩි විකිණීම | 25 0 | 30 0 | 40 0 |
| 12. | වළං විකිණීමේ ස්ථානයක් | 15 0 | 30 0 | |
| 13. | පළතුරු විකිණීම | 30 0 | 60 0 | 50 0 |
| 14. | එළවළු-පළතුරු සුළු වශයෙන් විකිණීම | 25 0 | 50 0 | |
| 15. | බේකරි කෑම විකිණීම (වෑන් එකෙන්) | 50 0 | 100 0 | |
| 16. | ඉරිඟු පළතුරු විකිණීමේ ස්ථානයක් | 50 0 | 60 0 | |
| 17. | මාලු ලෑලි එකකින් | 150 0 | 300 0 | 460 0 |
| 18. | මාලු ලෑලි භාගයකින් | 125 0 | | |
| 19. | මාලු කූඩයක් | 200 0 | | |
| 20. | අඩි 8 x 16 නිදහස් බිම | 200 0 | | |
| 21. | අඩි 8 x 24 නිදහස් බිම | 200 0 | | |
| 22. | මුදවාපු කිරි හට්ටි විකිණීම | 25 0 | 40 0 | 50 0 |
| 23. | ලොතරැයි විකිණීම සුළු වශයෙන් | 20 0 | 40 0 | 60 0 |
| 24. | ලිපි ද්‍රව්‍ය විකිණීම | 30 0 | 40 0 | 50 0 |
| 25. | ලුණු විකිණීම | 30 0 | 50 0 | |
| 26. | ඉරිඟු කරල් විකිණීම | 50 0 | 100 0 | |

| අනු. අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | රු. ශත | රු. ශත | රු. ශත |
|---|---|---|---|---|
| 27. | මාලු පෙට්ටි | 50 0 | 100 0 | |
| 28. | ප්ලාස්ටික් බඩු විකිණීම | 40 0 | 50 0 | 10 0 |
| 29. | රස කැවිලි විකිණීම | 20 0 | 25 0 | 30 0 |
| 30. | කුළු, වට්ටි, ලණු විකිණීම | 30 0 | | |
| 31. | සිල්ලර එළවළු විකිණීම (තරාදි එකකින්) | | 80 0 | 100 0 |
| 32. | සිල්ලර එළවළු විකිණීම (තරාදි දෙකකින්) | 70 0 | 80 0 | 150 0 |
| 33. | රෙදි විකුණන ස්ථානයක් | 30 0 | 80 0 | 100 0 |
| 34. | බිත්තර | 30 0 | 50 0 | |
| 35. | රට කජු විකිණීම | 15 0 | 20 0 | 30 0 |
| 36. | මෙට්ට විකිණීම | 50 0 | 100 0 | |
| 37. | සාප්පු බඩු විකිණීම | 40 0 | 100 0 | 120 0 |
| 38. | තුනපහ බඩු විකිණීම | 30 0 | 50 0 | |
| 39. | අයිස්ක්‍රීම් වාහනයකින් | 50 0 | | |
| 40. | ලුණු පැකට් විකිණීම | 15 0 | 20 0 | |
| 41. | තේ කුඩු විකිණීම | 25 0 | 30 0 | 40 0 |
| 42. | පැණි විකුණන ස්ථානයක් | 40 0 | | |
| 43. | මල් ගස් විකිණීම | 50 0 | | |
| 44. | කරවල වාහනයකින් අලෙවි කිරීම | 50 0 | 100 0 | |
| 45. | පාවහන් විකිණීම | 25 0 | 40 0 | 80 0 |
| 46. | කුකුල් පැටව් විකිණීම | 30 0 | 35 0 | |
| 47. | මුදු මාල විකිණීම | 30 0 | 50 0 | |
| 48. | කැසට් පීස්, වීඩියෝ පටි විකිණීම | 50 0 | | |
| 49. | බුලත් විකිණීම | 20 0 | 30 0 | 50 0 |
| 50. | පුවක් විකිණීම | 25 0 | 30 0 | 50 0 |
| 51. | දුම්කොළ විකිණීම | 25 0 | 30 0 | 50 0 |
| 52. | පැල විකිණීම | 50 0 | | |
| 53. | තල කැරලි විකිණීම | 30 0 | | |
| 54. | තේ කඩයක් පවත්වාගෙන යාම (කෑම සහිත, විදුලිය සහිත) | 100 0 | 150 0 | |
| 55. | තේ කඩයක් පවත්වාගෙන යාම (විදුලිය රහිත) | 50 0 | 70 0 | 100 0 |
| 56. | බේකරි කෑම සුළු වශයෙන් විකිණීම | 30 0 | 40 0 | 50 0 |
| 57. | බෙහෙත් බඩු විකිණීම | 30 0 | | |
| 58. | කෙසෙල් ගෙඩි වැන් එකෙන් විකිණීම | 30 0 | 40 0 | 50 0 |
| 59. | හාල් විකිණීම | 50 0 | 100 0 | |
| 60. | මාලු විකුණන ස්ථානයක් | 100 0 | 150 0 | 200 0 |
| 61. | පලා වර්ග විකිණීම | 30 0 | | |
| 62. | බුලත් විට විකිණීම | 15 0 | 20 0 | 25 0 |

01-09/7

---

**වවුනියාව නගර සභාව**

*2014 වර්ෂය සඳහා බද්ද*

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනත යටතේ 160(1) වැනි වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථාව විසින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම හා නිදහස් කිරීම්වලට යටත්ව වවුනියාව නගර සභාව විසින් 2009 වර්ෂයේ දී නගර සභා සීමාව තුළ පිහිටි ගෘහ, දේපළවල වාර්ෂික වටිනාකමින් (15%) දේපළ බද්දක් පැනවීමට වවුනියාව නගර සභාව විසින් තීරණය කර ඇති බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වවුනියාව නගර සීමාව තුළ පිහිටි නිශ්චල දේපළ සඳහා වාර්ෂික වටිනාකමින් 15% දේපළ බද්ද පිළිවෙලින් 2014 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්ගෙන් අවසන් වන කාර්තු 04කින් ගෙවා නිම කළ යුතුය. ඉහත සඳහන් වාර්ෂික වරිපනම් බදු මුදල් සම්පූර්ණයෙන් ගෙවන විට පහත සඳහන් වට්ටම් ලබන බවද මෙයින් දැනුම් දෙනු ලැබේ :-

*(අ)* 2014 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර මුළු වර්ෂයට ගෙවිය යුතු වරිපනම් ගාස්තු ගෙවනු ලැබුවහොත් එම මුදලින් 10% (සියයට දහයක්) ක වට්ටමක් දෙනු ලැබේ ;

*(ආ)* එම මුදල් කොටස් වශයෙන් ගෙවන විට වරිපනම් බදු ගෙවනු ලබන කාර්තුවේ පළමුවන මාසය තුළ ගෙවනු ලැබුවහොත් එසේ ගෙවනු ලබන මුදලින් 5% (සියයට පහක්) තවද ඉහත සඳහන් වරිපනම් බදු මුදල් එම කාර්තුවේ අවසන් දිනට හෝ ඊට පෙර ගෙවනු ලැබුවහොත් හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා නිකුත් කරනු ලැබූ ගාස්තුවක් අය කරගනු ලැබේ ;

*(ඇ)* ඉහත (අ), (ආ) පරිදි බදු නොගෙවන අය සඳහා පදිංචිව ඇත්නම් 15% අමතර බද්දක් ද, වෙනත් ඉඩම් සඳහා 20% බද්දක් ද, අයකරනු ලැබේ.

කේ. සත්තියසීලන්,<br>
ලේකම්,<br>
නගර සභාව,<br>
වවුනියාව

2013 දෙසැම්බර් මස 18 වැනි දින,<br>
වවුනියාව නගර සභා කාර්යාලයේ දී ය.

01-204/1

## වවුනියාව නගර සභාව

1979 අංක 42 දරන මහ නගර සභා සංශෝධිත ආඥාපනත (255 වැනි අධිකාරය වන)
165(6) වගන්තිය යටතේ නිවේදනය

වවුනියාව නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2014 ජනවාරි මස 01 වැනි දින සිට බද්දක් ගෙවීමට යටත් නොවුන කර්මාන්ත (වෙළෙඳ ව්‍යාපාර) කරගෙන යන්නාවූ සෑම කෙනකුටම පහත I වැනි තීරුවේ දැක්වෙන පරිදි ව්‍යාපාරය සම්බන්ධයෙන් බද්දක් ගෙවිය යුතු ය. වර්ෂයට ඉහතින් වූ වර්ෂයේ ලැබීමට අනුව කෙරෙන II තීරුවේ දැක්වෙන බද්ද ගෙවිය යුතු ය. මෙම බදු මුදල් 2014 මාර්තු මස 31 වැනි දිනට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. සත්තියසීලන්,
ලේකම්,
නගර සභාව,
වවුනියාව.

2013 දෙසැම්බර් මස 18 වැනි දින,
වවුනියාව නගර සභා කාර්යාලයේ දී ය.

**වෘත්තීන් සම්බන්ධයෙන් බදු**

| | *I තීරුව* *වර්ෂය සඳහා වෙළෙඳ ව්‍යාපාරයේ ලැබීම* | *II තීරුව* *රු. ශත* |
|---|---|---|
| 01. | රු. 6,000 නොඉක්මවන විට | නැත |
| 02. | රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට | 90 0 |
| 03. | රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට | 180 0 |
| 04. | රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 300 0 |
| 05. | රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| 06. | රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

***උපලේඛනය II***

01. මුදල් ණයට දෙන ව්‍යාපාරයක් සඳහා
02. උකස් බඩු ගන්නෙකුගේ ව්‍යාපාර ස්ථානයක් සඳහා
03. වෙන්දේසිකරුවෙකු වශයෙන් කටයුතු කිරීම සඳහා
04. පෞද්ගලික පාසලක් පවත්වාගෙන යාම
05. ගොඩනැගිලි ද්‍රව්‍ය සහ භාණ්ඩ ප්‍රවාහන කොන්ත්‍රාත්කරුවෙකුගේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා
06. කොමිස් නියෝජිතයකු වශයෙන් ව්‍යාපාරයක් සඳහා
07. නීතිමය වෘත්තීය ව්‍යාපාරයක් සඳහා
08. ප්‍රසිද්ධ නොතාරිස්වරුන්ගේ ව්‍යාපාරයක් සඳහා
09. වෛද්‍ය සේවාවක් පවත්වාගෙන යාම සඳහා
10. පෞද්ගලික බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම සඳහා
11. පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම සඳහා
12. පොදු ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා
13. සැලසුම් ශිල්පී ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා
14. පෞද්ගලික ප්‍රවාහන අයිතිකරුවන් සඳහා
15. ආදායම් බදු උපදේශක සේවාවක් පවත්වාගෙන යාම සඳහා
16. ප්‍රචාරක දැන්වීම් ආයතනයක් පවත්වාගෙන යාම සඳහා
17. කම්කරුවන් හා වෘත්තිකයන්ගේ සේවා සැපයීම සඳහා
18. රිය පැදවීම පුහුණුවීමේ ආයතනයක් සඳහා
19. විදුලි සැපයුම් හා සේවා සැපයීම සඳහා
20. යන්ත්‍ර උපකරණ සේවා සැපයීම සඳහා
21. අවමංගල්‍ය කටයුතු භාරකරුවන්ගේ ස්ථානයක් සඳහා
22. විගණන සේවා සැපයීම සඳහා
23. ගණකාධිකාරී සේවා සැපයීම සඳහා

01-204/3

---

## වවුනියාව නගර සභාව

නගර සභා සංශෝධිත ආඥාපනත - 255 වැනි අධිකාරය - 2014

1979 අංක 42 දරන නගර සභා පනතේ සංශෝධිත ආඥා පනතේ 164(2), 165 වගන්ති 14, 15 ප්‍රකාර බලපත්‍ර ගාස්තු හා බදු පහත දක්වා ඇති උපලේඛනයේ පරිදි වවුනියාව නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2014 ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පනවා අය කිරීමට තීරණය කරනු ලැබේ.

මෙම බදු මුදල් 2014 මාර්තු මස 31 වැනි දිනට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. සත්තියසීලන්,
ලේකම්,
නගර සභාව,
වවුනියාව.

2013 දෙසැම්බර් මස 18 වැනි දින,
වවුනියාව නගර සභා කාර්යාලයේ දී ය.

*164 වන වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තු - පළමු උපලේඛනය*

| අනු. අංකය | වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට රු. ශත | වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි වන විට රු. ශත |
|---|---|---|---|---|
| 01. | ස්වර්ණාභරණ නිපදවීමේ සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | මුද්‍රණ ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | රෙදිපිළි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | තේ සහ භෝජනාගාර ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | මෝටර් රථ උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | සිල්ලර බඩු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | ධාන්‍ය වර්ග අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | තේ කොළ පැකට් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | සිගරැට් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ලැගුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | කෘෂි රසායන බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කිරීමේ සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | රූපලාවන්‍ය ද්‍රව්‍ය ගබඩා කිරීමේ සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ටයර්, ටියුබ් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ශීත කල බීම වර්ග අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | බේකරියක් පවත්වාගෙන යාම | | | |
| 16. | භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | යකඩ ගෘහ භාණ්ඩ නිෂ්පාදන හා අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | කරවල වෙළෙඳාමක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | පාවහන් නිපදවීම, ගබඩා කිරීමේ සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | පින්තූර රාමු කිරීමේ සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ඔරලෝසු, අත් ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | වී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | පරණ පත්තර, හිස් ගෝනි, බෝතල්, ඇලුමිණියම්, යකඩ, සුන්බුන් එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | මත්පැන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | යතුරු පැදි, පා පැදි සහ ඇඳුම් මැසීමේ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | රථ වාහන සෝදා පිරිසිදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | ලැගුම්හලක්, නේවාසිකාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | රා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | මත්පැන් අලෙවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | යාන්ත්‍රික ලී මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | මිනී පෙට්ටි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | යන්ත්‍රානුසාරයෙන් කුඩු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | වැල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | විනාකිරි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | උළු, ගඩොල් වෙළෙඳාම කර්මාන්තයක් සඳහා තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | හඳුන්කූරු සෑදීමේ කර්මාන්තයක් සඳහා | | | |
| 42. | වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | යාන්ත්‍රික කළු ගල් වැඩපලක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට | වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා | වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි වන විට |
|---|---|---|---|---|
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 44. | ඖෂධ වර්ග වෙළෙඳාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | පටිගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | දුරකථන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | ඒජන්සි තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | කිරි එකතු කිරීම සහ වෙළෙඳාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | කුකුල් මස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | වාහන තීන්ත කිරීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | රූපවාහිනී යන්ත්‍ර විකිණීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | මාළු අයිස් දැමීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | තල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | ඇස් කණ්ණාඩි විකිණීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | රබර් මුද්‍රා සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | සපු පරාල හෝ පොල් පරාල විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | ජල පොම්ප යන්ත්‍ර අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | කිරිපිටි හෝ බිස්කට් වර්ග විකිණීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | රථවාහනවලට තෙල් පිරවුම් හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. | ආනයන අපනයන කටයුතු හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු කිරීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 62. | රූපවාහිනී යන්ත්‍ර හා විදුලි භාණ්ඩ විකිණීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | යකඩ ගෘහ භාණ්ඩ විකිණීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | ජංගම දුරකථන වෙළෙඳාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | උළු සහ කන්නාර් තහඩු වෙළෙඳාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | තෙල් පිරවුම් හලක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 67. | කුකුල් සහ සත්ත්ව ආහාර වෙළෙඳ සැලක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 68. | පොල් තෙල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 69. | රියදුරන් පුහුණුකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 70. | සිනමා ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 71. | නාම පුවරු සෑදීම සහ දැන්වීම් සෑදීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 72. | පිළිගැනීමේ සහ මඟුල් පෝරු ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 73. | නයිලෝන්, පුළුන් ගබඩා කිරීම සහ වෙළෙඳාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 74. | කොහු ලණු හෝ කඹ ගබඩා කිරීම සහ විකිණීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 75. | වෙළෙඳාම සඳහා රෙදි ගබඩා කිරීම සහ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |

### *උපලේඛනය II*

| | | | | |
|---|---|---|---|---|
| 01. | බයිසිකල් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | එළවළු සහ පළතුරු අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | රන් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | බෙලෙක් වැඩපොලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | වෙළෙඳාම සඳහා පුවත්පත්, සඟරා පොත්පත් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | කම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | දුම්කොළ හෝ බුලත් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | ගල්වලින් භාණ්ඩ සෑදීමේ වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | පොල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | තේ කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට රු. ශත | වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි වන විට රු. ශත |
|---|---|---|---|---|
| 16. | ටයර් ටියුබ් වෝල්කනයිස් වෙළඳාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ලී බඩු සහ දර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | දැන්වීම් පළ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | මසා නිමකල ඇඳුම් විකිණීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | කැසට් (vcd) ගී තැටි කුළියට දීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | අනු පිටපත් යන්ත්‍ර ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | සිමෙන්ති බ්ලොක් ගල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | වාහන කුළියට දීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | කෝවිල් පූජා බඩු විකිණීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |

01-204/2

---

## නිවිතිගල ප්‍රාදේශීය සභාව

සභාව සතු ක්‍රීඩා භූමි බදු දීමේ දී ගාස්තු අය කිරීම - 2014 වර්ෂය

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක (05):20:11 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 30 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

### යෝජනාව

නිවිතිගල ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩා භූමිය මෙහි පහත උපලේඛනයේ සඳහන් වූ කාර්යයන් සඳහා යොදා ගැනීමට අවසර දීමේ දී මෙහි සඳහන් ගාස්තු ප්‍රමාණයන් 2014 වර්ෂයේ සිට පනවා අය කිරීමට තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### උපලේඛනය

| මුදල් අය කරන සංදර්ශන සඳහා : | | රු. ශත |
|---|---|---|
| i. | දිනකට | 200 0 |
| ii. | මාසයක කාලයක් සඳහා | 4,500 0 |
| iii. | ආපසු ගෙවන ඇපතැන්පත් | 10,000 0 |

| මුදල් අය කරන සංදර්ශන හැර අනෙක් සෑම කටයුත්තක් සඳහා : | | රු. ශත |
|---|---|---|
| i. | දිනකට | 100 0 |
| ii. | මාසයක කාලයක් සඳහා | 2,000 0 |
| iii. | ආපසු ගෙවන ඇප තැන්පත් | 10,000 0 |
| iv. | මෙයට අමතරව ක්‍රීඩා භූමිය වෙන් කිරීමේ ගාස්තුව | 5,000 0 |
| | ජලය/විදුලිය සහ කාලය අනුව | 15,000 0 |

පහත කටයුතු සඳහා මුදල් අය කරනු නොලැබේ :

ක්‍රීඩා තරග/ආගමික/දේශපාලන/අධ්‍යාපනික සඳහා ගෙවීමෙන් නිදහස් වේ.

01-156/6

## නිවිතිගල ප්‍රාදේශීය සභාව

2014 වර්ෂය සඳහා නිකුත් කරන සහතික හා වෙනත් ආදායම් ගාස්තු අය කිරීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක (05):20:11 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව

2013 ඔක්තෝබර් මස 30 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

### උපලේඛන අංක 1

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පැවරී ඇති බලතල ප්‍රකාරව නිකුත් කරනු ලබන සහතික සඳහා මෙහි පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2011 වර්ෂයේ සිට පනවා අය කරනු ලබන බව මෙයින් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

| | | රු. ශත |
|---|---|---|
| 01. | වරිපනම් ලේඛනයේ නම සංශෝධනය කිරීමේ අයදුම්පත් ගාස්තුව | 150 0 |
| 02. | ගොඩනැගිලි අයදුම්පත්‍රයක් සඳහා | 250 0 |
| 03. | අනතුරුදායක ගස් ඉවත් කිරීමේ පෝරමයක් සඳහා | 120 0 |
| 04. | නැති වූ සහතික වල පිටපත් ලබා ගැනීම සඳහා (1 පිටපතකට) | 100 0 |
| 05. | කැළි කසල හා වෙනත් ද්‍රව්‍ය සඳහා ට්‍රැක්ටරය කුළියට දීම කි. මී. 1-10 දක්වා අයකරන ගාස්තුව | 350 0 |
| | පැටවීම හා බෑම සඳහා (වැඩිවන සෑම කි. මී. 1කට රු. 40 0 බැගින් අයකරනු ලැබේ) | 1,000 0 |
| 06. | ලේඛන සෙවීමේ හා ප්‍රතිඵල සහතික කිරීම් ගාස්තුව ලේඛන සෙවීම හා පිටපත් කිරීම - පළමු වසර | 150 0 |
| | අනෙකුත් සෑම වසරක් සඳහා | 50 0 |
| 07. | අයකර ගත හැකි ගාස්තු (මාළු වෙළඳාම, රසකැවිලි වෙළඳාම, ආහාර වර්ග, විසිතුරු භාණ්ඩ, රෙදි නිමි ඇඳුම් වෙළඳාම) | |

| | දිනකට රුත | මාස හයකට රු. |
|---|---|---|
| ලොරි රථ | 300 | 500 |
| වෑන් රථ | 300 | 500 |
| ත්‍රි රෝද රථ | 250 | 500 |
| බයිසිකල් | 200 | 500 |

01-156/12

**වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව**

2014 වර්ෂය සඳහා දේපළ බදු නියම කර අය කිරීම

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) දරන වගන්තිය යටතේ සංවර්ධනය වූ ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත් කර ඇති වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවේ සීමාව තුළ පිහිටි නෙලුම්කුලම්, කුමාන්කුලම්, සමයපුරම්, ගනේෂපුරම්, උක්කුලාන්කුලම්, තෝනිකල් යනාදී ගම් ප්‍රදේශ සියල්ලකම පිහිටා ඇති ඉඩම්වල හා ගොඩනැගිලිවල වාර්ෂික ඇස්තමේන්තුවෙන් 12% ක් දේපළ බදු ලෙස 2014.01.01 දින සිට මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යනාදී දිනවලින් අවසන් වන කාර්තු 04හි ගෙවීම් කළ හැකි පරිදි 2013 වර්ෂය සඳහා දේපළ බදු නියම කර අය කරනු ලබන බව 2012.12.03 වැනි දින පැවති 11 වැනි සභා රැස්වීමේ දී යෝජනා සම්මත කිරීමෙන් පහත පරිදි අයකිරීම් සිදු කරන බව මෙයින් දන්වා සිටිමි.

තව ද,

*(අ)* 1987 වර්ෂයේ අංක 15 දරන ඉහත සඳහන් පනතේ 161 වන පරිච්ඡේදය අනුව පහත සඳහන් පරිදි යම්කිසි ලිඛිත අණ කිරීමක් ලබා දීමේ වියදම වශයෙන් මුදලක් අය කරනු ලැබේ :-

I. පදිංචිව සිටින ගෙවත්තටත් හිස් ඉඩම් වෙනුවෙන් පවතින හිඟ මුදල් සඳහා සියයට පහළොවක් (15%) ;

II. පදිංචි ගෙවත්තේ හිස් ඉඩම් හැර වෙනත් දේපළවල නාමයෙන් ඇති හිඟ මුදල් සම්බන්ධයෙන් සියයට විස්සක් (20%) ද වේ.

*(ආ)* 2013 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර 2013 වර්ෂය සඳහා කාර්තු 04හි දේපළ බද්ද ගෙවන්නන් වෙනුවෙන් 10% ක වට්ටමක් දෙනු ලැබේ.

*(ඇ)* 2014 යම්කිසි කාර්තුවක 12 වැනි මාසයේ නියමිත දේපළ බද්ද ගෙවන්නන්හට ඒ වෙනුවෙන් සියයට පහක (05%) වට්ටමක් දෙනු ලැබේ.

ක. සිවලිංගම්,
සභාපති,
වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව.

2013 නොවැම්බර් මස 25 වැනි දින,
වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව,
මන්නාරම් පාර,
වවුනියාව.

01-125/7

---

**වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව**

**1987 වර්ෂයේ 15 වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව**

පනත යටතේ මාර්ගය දෙපස පිහිටි විදුලි හා දුරකථන සම්ප්‍රේෂණ කිරීම සම්බන්ධව දැනුම් දීම - 2014

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 60 වගන්තියේ 09 පරිච්ඡේදයෙන්, මට පවරා ඇති රෙගුලාසීන්ට අනුව වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව පරිපාලන බල ප්‍රදේශය තුළ මාර්ගය දෙපස පිහිටි විදුලිය, දුරකථන සම්ප්‍රේෂණ කණු සකස් කිරීමේදී සභාවේ අනුමැතියකින් තොරව සිදුකළ නොහැක. 2013.01.01 වැනි දින සිට අය කරන පහත පරිදි එක් කණුවක් සඳහා අය කිරීම් 2013.11.29 වැනි දින පැවති 9 වැනි සභා රැස්වීමේදී යෝජනා කර එය සම්මත කිරීමෙන් පහත පරිදි අය කිරීම් සිදු කරන බව මෙයින් දන්වා සිටිමි.

| *අංක* | *විස්තරය* | *2013 වර්ෂය සඳහා අය කිරීම රු. ශත* |
|---|---|---|
| 01. | එක් විදුලි කණුවකට (අවුරුද්දකටම) | 120 0 |
| 02. | දුරකථන සම්ප්‍රේෂණ (අවුරුද්දකටම) | 120 0 |
| 03. | වෙනත් කණුවක් සිටුවීමට මාර්ග නීති | 150 0 |

ක. සිවලිංගම්,
සභාපති,
වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව.

2013 නොවැම්බර් මස 25 වැනි දින,
නෙරියකුලම් වීදිය, නෙලුක්කුලම්,
වවුනියාව,
වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවේ දී ය.

01-125/9

## නිවිතිගල ප්‍රාදේශීය සභාව

2014 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක (05)20:01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2013 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් බද්දසෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2014 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 30 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ :

(අ) 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නිවිතිගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ වල පිහිටි සෑම නිශ්චල දේපළක 2013 වර්ෂයේ දී බල පැවැත්වූ වාර්ෂික වටිනාකම 2014 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමට,

(ආ) එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර නිවිතිගල ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ තුළ පිහිටි සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමින් ගෘහ ඒකක දේපළක් මත සියයට පහ (5%) වරිපනමක්ද, ව්‍යාපාරික ඒකක දේපළක් මත සියයට හත (7%) වරිපනමක්ද, 2014 වර්ෂයේ දී පනවා අය කිරීමට ; සහ

(ඇ) 134 වැනි වගන්තියේ (6) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර යථෝක්ත වාර්ෂික වරිපනම් 2014 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට නිවිතිගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

01-156/1

## නිවිතිගල ප්‍රාදේශීය සභාව

2014 වර්ෂය සඳහා පරීක්ෂණ හා සේවා ගාස්තු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක (05):20:10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 30 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 49(අ) වගන්තිය ප්‍රකාර නොපවරා ගැනීමේ/ වීථි රේඛා සහතික පත් සඳහා පරීක්ෂණ හා සේවා ගාස්තු අයකර ගැනීම.

| | | රු. ශත |
|---|---|---|
| 01. | සහතික නිකුත් කිරීමේ ගාස්තුව | 750 0 |
| 02. | පරීක්ෂණ ගාස්තුව | 500 0 |

01-156/11

---

## නිවිතිගල ප්‍රාදේශීය සභාව

2014 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

**විනෝද බදු ආඥා පනතේ දෙවැනි වගන්තිය (1) උප වගන්තිය**

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක (05):20:06 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 30 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

### යෝජනාව

(267 වන අධිකාරය වන) විනෝද බදු ආඥා පනතේ දෙවන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, නිවිතිගල ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ ප්‍රදේශයන්හි පවත්වන ලද (තත් ආඥාපනතේ විස්තර කර ඇති) විනෝද කටයුත්තකට ඇතුලුවීම සඳහා කරන ලද ගෙවීම්වලින් මෙහි නිරූපිත අනුප්‍රමාණ අනුව වූ බද්දක්, මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළකරන ලද දින සිට පනවා අයකළ යුතු යැයි නිවිතිගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

176 වැනි අධිකාරය වන ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥා පනතේ තුන්වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තුව

*ගෙවූ මුදල :*

| | |
|---|---|
| රු. 50 ට නොවැඩි වූ විට | 10% |
| රු. 50 ට වැඩි එහෙත් රු. 100 ට නොඅඩු වූ විට | 10% |
| රු. 100 ට වැඩි එහෙත් රු. 150 ට නොඅඩු වූ විට | 10% |
| රු. 200 ට වැඩි එහෙත් රු. 250 ට නොඅඩු වූ විට | 10% |
| රු. 250 ට වැඩි වූ විට | |

*විනෝද බදු යටතේ බලපත්‍ර ගාස්තු අය කිරීම :*

| | රු. ශත |
|---|---|
| 01. මුදල් අය කරන සංගීත සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව | 1,000 0 |
| 02. මුදල් අය නොකරන සංගීත සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව | 500 0 |
| 03. මුදල් අය කරන සර්කස් සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව | 1,000 0 |
| 04. නාට්‍ය සංදර්ශනයක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍ර ගාස්තුව | 500 0 |

වැඩිවන සෑම දිනයක් සඳහාම රු. 50 බැගිනි.

01-156/7

---

## නිවිතිගල ප්‍රාදේශීය සභාව

2014 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක (05):20:05 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 30 වැනි දින,
නිවිතිගල,
නිවිතිගල ප්‍රාදේශීය සභාවේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ -

*(අ)* (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, නිවිතිගල ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ පළමුවැනි කොටසේ නිරූපිත යම් ව්‍යාපාරයක් 2014 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකු මත එකී ව්‍යාපාරයේ 2013 ආදායම දෙවන කොටසේ (1) වැනි තීරයේ නිරූපිත යම් සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක දෙවැනි තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ බද්දක් පනවා අය කිරීමට ; සහ

*(ආ)* (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින් යථොක්ත බද්ද 2014 අප්‍රේල් මස 30 වැනි දිනට ප්‍රථම ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි නියම කිරීමට නිවිතිගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

### *උපලේඛනය*

*පළමුවැනි කොටස*

*ව්‍යාපාර බද්ද අදාළ වන ව්‍යාපාර ලැයිස්තුව :*

1. කොමිස් ඒජන්තවරු
2. වෙන්දේසිකරුවන්
3. බ්‍රෝකර්වරුන්
4. නියෝජිත තැපැල් හලක්
5. සමුපකාර තොග වෙළඳ සංස්ථාවක්
6. කොන්ත්‍රාත්කරුවන්
7. පෞද්ගලික පංති (අධ්‍යාපන) පවත්වන්නවුන්
8. සැපයුම්කරුවන්
9. රක්‍ෂණ නියෝජිතයින්
10. ප්‍රවාහන නියෝජිතයින්
11. බැංකු හා රක්ෂණ සමාගම්
12. රියැදුරු පුහුණු ආයතනය
13. (බලපත්‍ර ලත්) මත්පැන් නිෂ්පාදනය කිරීම
14. විදේශ රැකියා නියෝජිත ආයතන
15. කාඩ්වලින් හා කාසි මගින් දුරකථන ඇමතුම් ලබා ගත හැකි ප්‍රධාන නගරවල ඇති දුරකථන කුළුණු
16. උත්සව භාණ්ඩ කුළියට දෙන්නෝ
17. කුඩා පරිමාණයේ විදුලි බලාගාර පවත්වාගෙන යාම
18. කායවර්ධන මධ්‍යස්ථානයක්
19. තේ කර්මාන්ත ශාලා
20. රබර් කර්මාන්ත ශාලා
21. ඇඟළුම් කර්මාන්ත ශාලා
22. නොතාරිස්, නීතිඥ, පුද්ගලික මිනින්දෝරු
23. ලොතරැයි නියෝජිතවරුන්
24. තෙල් විකිණීමේ ස්ථාන පැවැත්වීම (ඉන්ධන පිරවුම්හලක්)
25. බෙහෙත් ශාලාවක් (පෙරදිග/බටහිර)
26. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරන මෝලක්
27. මෝටර් රථ හෝ බෝඩි නිපදවීමේ ස්ථානයක්
28. වාහන සේවා ස්ථානයක්
29. පොදු දුරකථන කුටිර හා දුරකථන කවුළු පවත්වාගෙන යාම
30. දැව විකිණීම
31. ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම වාර්ෂික බලපත්‍ර ගාස්තුව
32. ගඩොල් හෝ උළු විකිණීම
33. කුකුළන් ඇති කිරීම
34. බැටළුවන්, එළුවන් හෝ ඌරන් ඇති කිරීම
35. විද්යුත් ලෝහාලේපණය කිරීම
36. බැටරි චාජ් කිරීමේ හෝ අළුත් වැඩියා කිරීම
37. මුද්‍රණාලයක් පැවැත්වීම
38. අළුත් හෝ පරණ ලෝහ විකිණීම
39. යකඩ වැඩ කම්හලක්
40. තේකොළ පැකට් කරන ස්ථානයක් (කුළුබඩු වර්ග)
41. රබර් සීල් සකස් කිරීම
42. ලුණු පැකට් කිරීම
43. කුෂන් මෙට්ට වැඩ පලක්
44. පාවහන් අලුත්වැඩියා කිරීම
45. කොමියුනිකේෂන් එකක් පැවැත්වීම
46. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම
47. ලියවන පට්ටල්
48. පින්තාරු කිරීමේ ස්ථානයක්
49. දේශීය රැකියා නියෝජිත ආයතන
50. තොරතුරු තාක්ෂණය පිළිබඳ ආයතනයක් පවත්වාගෙන යාම
51. මත්පැන් හා රටබීම සාප්පු/බියර් සාප්පු

52. ටයර් ටියුබ් විකිණීම
53. මනාලියන් හැඩ ගැන්වීමේ ස්ථානයක්
54. පරිගණක ආශ්‍රිත වෙළඳ කටයුත්තක්
55. වානිජමය කටයුත්තක් සඳහා කාර්යාලයක් පවත්වාගෙන යාම
56. නවීන හා පාවිච්චි කරන ලද වාහන මිලදී ගැනීම, විකිණීම.
57. නවීන හා පාවිච්චි කරන ලද වාහනවල කොටස් මිලදී ගැනීම, විකිණීම
58. කුෂන් මෙට්ට වැඩපලක්
59. ලිහිසි තෙල් විකිණීම
60. තෙල් විකිණීමේ ස්ථාන පැවැත්වීම (ඉන්ධන පිරවුම්හලක්)
61. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරනු ලබන ගල් මෝලක්
62. ග්‍රොසරි පවත්වාගෙන යාම
63. ජංගම දුරකථන අලෙවිසැල් පවත්වාගෙන යාම
64. දුරකථන සන්නිවේදන කුළුණු පවත්වාගෙන යාම
65. සංචාරක වෙළදාම

දෙවන කොටස

| | *I වන තීරුව* *2014 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම* | *II වන තීරුව* *රු. ශ.* |
|---|---|---|
| 1. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. | රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට | 90 0 |
| 3. | රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට | 180 0 |
| 4. | රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 360 0 |
| 5. | රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| 6. | රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

01-156/5

---

**නිවිතිගල ප්‍රාදේශීය සභාව**

2014 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක (05):20:04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

2013 ඔක්තෝබර් මස 30 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර

*(අ)* නිවිතිගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2014 වර්ෂයේ පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ අංක 1 වැනි තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම එම උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ කර්මාන්ත බද්දක් 2014 වර්ෂයේ දී පනවා අය කිරීමට,

*(ආ)* 2013 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථොක්ත බද්ද 2014 අප්‍රේල් මස පළමුවන දිනට ප්‍රථම කර්මාන්ත කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට; සහ

*(ඇ)* 2014 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථොක්ත බද්ද කර්මාන්තය ආරම්භ කර මාස තුනක් (03)ක් ඇතුළත කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට නිවිතිගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *I වැනි තීරුව* *කර්මාන්තයේ ස්වභාවය* | *II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශ.* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශ.* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි රු. ශ.* |
|---|---|---|---|---|
| 01. | රෙදි පිළි විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | පිඟන්, වීදුරු බඩු, විසිතුරු බඩු, ඇළුමිනියම් බඩු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | පොත් පත් ලිපි ද්‍රව්‍ය විකිණීම | 350 0 | 550 0 | 850 0 |

| අනු. අංකය | *I වන තීරුව* *කර්මාන්තයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 දක්වා* *රු. ශ.* | *II වන තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා* *රු. ශ.* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි* *රු. ශ.* |
|---|---|---|---|---|
| 04. | බටහිර ඖෂධ විකිණීම | 500 0 | 550 0 | 1,000 0 |
| 05. | ආයුර්වේද ඖෂධ විකිණීම | 500 0 | 550 0 | 850 0 |
| 06. | විදුලි උපකරණ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | වාහන අමතර කොටස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | කෘත්‍රිම දත් බැඳීම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | ඇස් කණ්ණාඩි විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | තැටි ගත කිරීම හා පටි ගත කිරීමේ ස්ථානයක් | 300 0 | 550 0 | 850 0 |
| 11. | මල් පැළ විකිණීම | 400 0 | 550 0 | 850 0 |
| 12. | රබර් දුම් ගැස්සවීම හෝ සීට් නිපදවීම | 300 0 | 550 0 | 800 0 |
| 13. | තේ දළු එකතු කිරීමේ ස්ථානයක් | 300 0 | 550 0 | 850 0 |
| 14. | ඡායාරූප ශාලාවක් | 400 0 | 750 0 | 1,000 0 |
| 15. | රජයේ පිළිගත් ලොතරැයි විකිණීම | 400 0 | 550 0 | 850 0 |
| 16. | වාහන සේදීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | නියෝජිත තැපැල් කාර්යාලයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | පාවහන් හා සම්භාණ්ඩ නිපදවීම | 400 0 | 550 0 | 850 0 |
| 20. | ඉදල් කොහු පාපිසි හා වෙනත් කෙඳි නිෂ්පාදන නිපදවීම/විකිණීම | 200 0 | 550 0 | 800 0 |
| 21. | බුලත්, පුවක්, දුම්කොළ විකිණීම | 300 0 | 550 0 | 800 0 |
| 22. | සුළු අපනයන භෝග එක් රැස් කිරීම/විකිණීම | 400 0 | 550 0 | 800 0 |
| 23. | මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීම/අලෙවි කිරීම | 300 0 | 550 0 | 800 0 |
| 24. | භූමි තෙල් විකිණීම | 300 0 | 550 0 | 800 0 |
| 25. | හඳුන්කූරු නිෂ්පාදනය හා පැකට් කිරීම | 300 0 | 550 0 | 800 0 |
| 26. | පින්තූර රාමු කිරීම | 400 0 | 600 0 | 800 0 |
| 27. | හුණු පිළිස්සීම, සකස් කිරීම හෝ විකිණීම | 400 0 | 600 0 | 800 0 |
| 28. | කබොක් හෝ කළු ගල් වලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | සිමෙන්ති භාණ්ඩ නිපදවීම හෝ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | වෑල්ඩින් වැඩ කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | ගෘහ භාණ්ඩ වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | වඩු කර්මාන්තය | 400 0 | 600 0 | 800 0 |
| 33. | දර විකිණීම | 300 0 | 550 0 | 800 0 |
| 34. | ස්වර්ණාභරණ නිපදවීම හෝ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | වාත්තු කර්මාන්තය | 300 0 | 550 0 | 800 0 |
| 36. | ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | කොම්පෝස්ට් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | සත්ත්ව ආහාර නිපදවීම හෝ විකිණීම | 500 0 | 600 0 | 800 0 |
| 39. | හිස් ගෝනි, හිස් බෝතල්, පරණ කඩදාසි මිලට ගෙන විකිණීම | 500 0 | 750 0 | 850 0 |
| 40. | තොග වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | කුළු බඩු වෙළඳාම | 300 0 | 550 0 | 800 0 |
| 42. | සුරුට්ටු හෝ බීඩි නිපදවීම හෝ විකිණීම | 300 0 | 550 0 | 800 0 |
| 43. | අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය | 350 0 | 550 0 | 800 0 |
| 44. | නාම පුවරු සැකසීම | 400 0 | 550 0 | 800 0 |
| 45. | පැණි හෝ හකුරු නිපදවීම හෝ විකිණීම | 350 0 | 550 0 | 800 0 |
| 46. | ලෑලි පෙට්ටි හෝ තේ පෙට්ටි නිපදවීම හෝ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | රබර් කිරි එකතු කිරීම හෝ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | මිනී පෙට්ටි නිපදවීම හෝ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | එල්.පී. ගෑස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | කොන්ක්‍රීට් කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | වී/මිරිස් මෝලක් | 350 0 | 550 0 | 850 0 |
| 52. | වැලි එක් රැස් කිරීම, විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | ලී කැටයම් කිරීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | කුළු බඩු, රස කැවිලි නිපදවීම/පැකට් කිරීම හෝ විකිණීමේ ස්ථානයක් | 300 0 | 550 0 | 800 0 |
| 55. | සිල්ලර වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | කළු ගල් වලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

01-156/4

**නිවිතිගල ප්‍රාදේශීය සභාව**

2014 වර්ෂය සඳහා කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට නිකුත් කරනු ලබන බලපත්‍ර ගාස්තු පැනවීම අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක (05):20:03 යටතේ නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව, කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ නිවිතිගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2014 වර්ෂය තුළදී නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මත ගාස්තුවක් පනවා අය කරනු ලබන බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

2013 ඔක්තෝබර් මස 30 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

**යෝජනාව**

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තයන් වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ, අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමට නිවිතිගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශ.* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 සිට රු1,500 දක්වා රු. ශ.* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි රු. ශ.* |
| 01. | බත් කඩ, ආපන ශාලා සහ තේ හෝ කෝපි වෙළඳාම | 300 0 | 600 0 | 1,000 0 |
| 02. | හෝටල් | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | ලැගුම් හල් | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | බේකරි | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | නරක් විය හැකි ආහාර ද්‍රව්‍ය විකිණීම, රසකැවිලි | 300 0 | 600 0 | 1,000 0 |
| 06. | මාළු විකිණීම (ගොඩනැගිල්ලක් තුළ) | 500 0 | 750 0 | 1,000 0 |
| 07 | මස් විකිණීම (ගොඩනැගිල්ල තුළ) | 500 0 | 750 0 | 1,000 0 |
| 08 | සිසිල් බීම කර්මාන්තශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | ලොන්ඩරි | 300 0 | 600 0 | 1,000 0 |
| 10. | ගවගාල් | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | කිරි පට්ටි හා කිරි වෙළඳාම එළකිරි/මීකිරි එකතු කිරීම හෝ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | කොණ්ඩා සැකසීමේ සැලුන්හල් හා බාබර් සාප්පු | 300 0 | 650 0 | 1,000 0 |
| 13. | අයිස් කර්මාන්ත ශාලා/යෝගට්/අයිස්පැකට් | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | සාතක මඩු | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | බිම්මල් වගා කිරීම, නිපදවීම, විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | පොහොර හෝ රසායන ද්‍රව්‍ය විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | එළවළු/පළතුරු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | පිසින ලද ආහාර සකස් කර සපයන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

01-156/3

**නිවිතිගල ප්‍රාදේශීය සභාව**

2014 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් - දෘශ්‍ය පරිසර බදු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක (05):20:07 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 30 වැනි දින,
නිවිතිගල,
නිවිතිගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 හා 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශේෂ ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසෙහි ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කර ඇති අතුරු ව්‍යවස්ථාවල 39 වැනි ඡේදය යටතේ නිවිතිගල ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් මෙහි පහත සඳහන් පරිදි එක් එක් දැන්වීමකට ගාස්තුවක් 2014 ජනවාරි 01 වැනි දින සිට පනවා අය කිරීමට නිවිතිගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය".

| | *ප්‍රචාරක දැන්වීම් විස්තර* | *ගාස්තුව* <br> *රු. ශත* |
|---|---|---|
| 01. | ස්ථිර ප්‍රචාරක දැන්වීම් සඳහා වර්ග අඩියකට | 40 0 |
| 02. | තාවකාලික මාස 06ට අඩු බැනර් දැන්වීමක් සඳහා වර්ග අඩියකට | 30 0 |
| 03. | විශාල දැන්වීම් පුවරු/ගුවන් පුවරු වර්ග අඩියකට | 30 0 |

01-156/8

---

**නිවිතිගල ප්‍රාදේශීය සභාව**

2014 වර්ෂය සඳහා වාහන ගාල් කිරීම වෙනුවෙන්
බදු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක (05):20:08 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,

2013 ඔක්තෝබර් මස 30 වැනි දින,
නිවිතිගල,
නිවිතිගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

2014 ජනවාරි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිවිතිගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කරවිට, දෑල, නිවිතිගල යන නගරවල කුලියට දීම හා ව්‍යාපාරික කටයුතු සඳහා නවතා තබන වාහනවලින් මෙහි පහත උපලේඛනය පරිදි වාර්ෂික බද්දක් පනවා අයකිරීමට තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

***උපලේඛනය***

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | ලොරියක් හෝ පෞද්ගලික බස් රථයක් හෝ මෝටර් කෝච් රථයක් සඳහා | 500 0 |
| 02. | වෑන් රථයක් සඳහා | 350 0 |
| 03. | ත්‍රිරෝද රථයක් සඳහා | 200 0 |
| 04. | සංචාරක වෙළඳ රථයක් සඳහා | 200 0 |

01-156/9

**නිවිතිගල ප්‍රාදේශීය සභාව**

2014 වර්ෂය සඳහා වාහන සහ සතුන් පිළිබඳ බදු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක (05):20:09 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 30 වැනි දින,
නිවිතිගල,
නිවිතිගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභා වෙත ලැබී ඇති බලතල ප්‍රකාර නිවිතිගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2014 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකු මතම, එහි II වන තීරුවේ, අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2014 වර්ෂය සඳහා පනවා අයකිරීමට නිවිතිගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය".

**උපලේඛනය**

| | *I වන තීරුව* | *II වන තීරුව* <br> *රු. ශත* |
|---|---|---|
| (i) | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| (ii) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා - | |
| | *(අ)* වෙළඳ කාර්යය සඳහා යොදවා ගන්නේ නම් | 18 0 |
| | *(ආ)* වෙළඳ කාර්යය නොවන කාර්යය සඳහා යොදවා ගන්නේ නම් | 4 0 |
| (iii) | සෑම කරත්තයක් සඳහා | 20 0 |
| (iv) | සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| (v) | සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| (vi) | සෑම අශ්වයෙකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | 15 0 |
| (vii) | සෑම ඇතෙකු සඳහා | 50 0 |

02. විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

01-156/10

**නිවිතිගල ප්‍රාදේශීය සභාව**

2014 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක (05):20:02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද, සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2014 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2014 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%)ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,

2013 ඔක්තෝබර් මස 30 වැනි දින,
නිවිතිගල,
නිවිතිගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ -

(අ) 146 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර නිවිතිගල ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමක 2013 වර්ෂයේ දී බලාත්මක වූ සත්‍යොක්ෂණය 2014 වර්ෂයේ සත්‍යොක්ෂණය ලෙස පිළිගැනීමට;

(ආ) 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, එකී උපවගන්තියේ පළමු අතුරු විධානය යටතේ 1989.02.03 දිනැති අංක IV(අ) දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයකින් අක්කර බද්ද නියම කිරීමේ සහ අය කිරීමේ කාර්යය සඳහා පළාත් පාලන අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර 01කට නොඅඩු එහෙත් හෙක්ටයාර 05කට අඩු සෑම ඉඩමක් මත, රුපියල් පනහක් (රු. 50.00) අනුප්‍රමාණය අනුව වූ අක්කර බද්දක් සහ හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩි සෑම ඉඩමක සෑම හෙක්ටයාරයක් මත රුපියල් දහය (රු. 10.00) බැගින් වූ අක්කර බද්දක් 2014 වර්ෂයේ පනවා අය කිරීමට නිවිතිගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

01-156/2

**අඹගමුව ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත - ජලය සැපයීමේ ගාස්තු - 2014 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව 126 වැනි වගන්තිය යටතේ සම්පාදනය කරන ලද්දා වූ 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 (පළාත් පාලන) අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයේ ප්‍රකාශ කරන ලද්දා වූ සම්මත අතුරු ව්‍යවස්ථාවන්හි 34 වැනි බාණ්ඩයේ 40 (1) අතුරු ව්‍යවස්ථාව යටතේ අඹගමුව ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන ජල සේවාවන් සඳහා පහත සඳහන් පරිදි, ජල ගාස්තුවක් 2014 වර්ෂය සඳහා පනවා අය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. ජල මීටර සවිකර ඇති ප්‍රදේශයන්හි (වටවල, හොන්සි) උපලේඛන පරිදි,
2. මීටර සවිනොකර ජලය සපයන ප්‍රදේශයන්හි -

(i) ගෘහස්ථ ජල සේවා සඳහා මසකට රුපියල් 150 ක් බැගින් ;
(ii) ව්‍යාපාර ස්ථානයන්හි ජල සේවා සඳහා මසකට රුපියල් 200 බැගින් ;
(iii) හෝටල් හා බේකරි ස්ථානයන්හි ජල සේවා සඳහා මසකට රුපියල් 300 බැගින් ;
(iv) රජයේ ආයතන සඳහා මසකට රුපියල් 150 බැගින්

අය කෙරේ.

එම්. එස්. වෙල්ලයන් දිනේෂ්,
සභාපති,
අඹගමුව ප්‍රාදේශීය සභාව,

2013 දෙසැම්බර් මස 10 වැනි දින,
ගිනිගත්හේන,
අඹගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| ප්‍රභේදය | | අයකුම | | ඒකකයට අය කිරීම රු. ශත |
|---|---|---|---|---|
| ගෘහ සේවා හා රජයේ ආයතන | 01. | 01-10 | අවමය | 150 0 |
| | | 11-20 | | 6 0 |
| | | 21-30 | | 7 0 |
| | | 31-50 | | 9 0 |
| | | 50ට වැඩි ඒකකයකට | | 15 0 |
| වෙළෙඳ ආයතන | 02. | 01-10 | අවමය | 200 0 |
| | | 11-20 | | 7 0 |
| | | 21 - 30 | | 8 0 |
| | | 31 - 50 | | 11 0 |
| | | 50ට වැඩි ඒකකයකට | | 17 0 |
| හෝටල් හා බේකරි | 03. | 01-10 | අවමය | 350 0 |
| | | 11-20 | | 8 0 |
| | | 21-30 | | 9 0 |
| | | 31-50 | | 12 0 |
| | | 50ට වැඩි ඒකකයකට | | 18 0 |
| ඉදිකිරීම් කටයුතු ආදිය | 04. | ඒකක (01) ක් සඳහා | අවමය | 500 0 |
| සංචාරක හෝටල් ආගන්තුක නිවාස | 05. | ඒකක (01) ක් සඳහා | අවමය | 750 0 |
| මාසික මීටර නඩත්තු ගාස්තුව | | | අවමය | 25 0 |

01-157/3

---

**අඹගමුව ප්‍රාදේශීය සභාව**

බලපත්‍ර ගාස්තු හා බදු 2014

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147, 149, 150,151 හා 152(1) වැනි වගන්ති ප්‍රකාර අඹගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ දක්වා ඇති පරිදි ඇතැම් ව්‍යාපාර සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම පදනම් වූ වාර්ෂික ගාස්තු ද ඇතුළුව වෙළෙඳ ව්‍යාපාර සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ව්‍යාපාරයේ ආදායම මත පදනම් වූ වාර්ෂික බද්දක් ද 2014 වර්ෂය සඳහා පනවා අය කිරීමට තීරණය කරන ලද බවත්, එකී බලපත්‍ර ගාස්තු හා බදු 2014.03.31 දිනට ප්‍රථම මෙම සභාව වෙත ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එස්. වෙල්ලයන් දිනේෂ්,
සභාපති,
අඹගමුව ප්‍රාදේශීය සභාව,
ගිනිගත්හේන.

2013 දෙසැම්බර් මස 10 වැනි දින,
අඹගමුව ප්‍රාදේශීය සභාව,
ගිනිගත්හේන.

**උපලේඛන අංක 01**

බලපත්‍ර ගාස්තු 149 වැනි වගන්තිය

| අනු. අංකය | ව්‍යාපාර ස්වභාවය | | වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත |
|---|---|---|---|---|---|
| 1. | ගඩොල් හෝ උළු ගබඩා කිරීමේ ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීමේ ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | හුණු, පිළිස්සීම,සකස් කිරීම හෝ විකිණීම සඳහා ගබඩා කිරීමේ ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | කබොක්, බොරළු හෝ කළුගල් කැණීමේ ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | සිමෙන්ති කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනය/අලෙවිය | | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | කළුගල් පිපිරවීමේ සහ කළුගල් කැඩීමේ ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම | | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | බිත්තර හා මස් පිණිස කුකුළන් ඇති කරන ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | බැටළුවන්, එළුවන් හෝ ඌරන් ඇති කරන ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | සුරතල් මසුන් ඇති කිරීමේ ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | විකිණීම සඳහා ශීත කළ මස් හෝ මාළු ගබඩා කරන ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | සත්ව ආහාර නිෂ්පාදනය හෝ ගබඩා කරන ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් හෝ සකස් කිරීමේ ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | කිරි පට්ටියක් | | 500 0 | 750 0 | 1,000 0 |
| | දෙනුන් 03ක් දක්වා | 01 | | | |
| | දෙනුන් 04ක් හෝ 05ක් දක්වා | 02 | | | |
| | දෙනුන් 06 සිට 10 දක්වා | 03 | | | |
| | දෙනුන් 10ට වැඩි | 04 | | | |
| 16. | මාළු වෙළෙඳසැලක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ගවමස් වෙළෙඳසැලක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | මෝටර් රථ වාහන හෝ ලොරි බොඩි නිපදවීමේ ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | යතුරු පැදි, ත්‍රිරෝද රථ අළුත්වැඩියා කරන ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | බයිසිකල් අළුත්වැඩියා කරන ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | ටයර්, ටියුබ්, වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 22 | මෝටර් වාහන අළුත්වැඩියා කරන ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | විද්‍යුත් ලෝහලේපනය කරන ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | ටයර් නැවත පිරවීමේ කම්හලක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | බැටරි චාර්ජ් කිරීමේ හෝ අළුත්වැඩියා කරන ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | මෝටර් රථ වාහන සේවා ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | වෑල්ඩින් වැඩපලක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී, විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | ඔරලෝසු අළුත්වැඩියා කරන ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | විදුලි උපකරණ විකිණීම | | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අලෙවිය | | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | ජංගම දුරකථන අලෙවිය | | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය කරන ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | ගිණිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා නිපදවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | වඩු කර්මාන්තශාලාවක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කිරීම | | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | යන්ත්‍රානුසාරයෙන් ලී ඉරන මෝලක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | ලෑලි පෙට්ටි හෝ තේ පෙට්ටි නිපදවීමේ ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | මිනී පෙට්ටි නිපදවීමේ හෝ අලෙවි මධ්‍යස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | බෙලෙක් වැඩපලක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | වාත්තු වැඩපලක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | ඇළුමිනියම් නිපදවීමේ ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | දැව ගබඩාවක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | දර මඩුවක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | ශීතකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් | | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | විදුලි කාර්මික වැඩපලක් | | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | ව්‍යාපාර ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත |
|---|---|---|---|---|
| 47. | විදුලි උපකරණ අමතර කොටස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | පින්තාරු, තීන්ත, වාර්නිස්, ඩිස්ටැම්පර් | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | විසිරි පින්තාරු කිරීමේ (ස්ප්‍රේ පේන්ට්) ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | පොහොර හෝ රසායන ද්‍රව්‍ය ගබඩා කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | පෙට්‍රල්, ඩීසල් හෝ වෙනත් ඛනිජ තෙල් විකිණීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | සබන් නිෂ්පාදනය කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | සිමෙන්ති ගබඩා කිරීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | කරවල, ලුණු, මාළු, ගබඩා කර තැබීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | වී තැම්බීමේ හෝ සහල් සැකසීමේ මධ්‍යස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | ආහාරපාන (ඇනවුම් මත) සැපයීමේ (Catering Service) ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | රස කැවිලි නිෂ්පාදනය කරන හෝ විකිණීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. | ලැගුම්හලක් පවත්වාගෙන යාම (නවාතැන් පලක්) | 500 0 | 750 0 | 1,000 0 |
| 62. | තේ හෝ කෝපි කඩයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | තේ කොළ පැකට් කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | ස්වභාවික වතුර බෝතල් කිරීමේ කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | සිසිල් බීම තොග වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | සරුවත් හෝ සිසිල් බීම වෙළෙඳසැලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 67. | බත් කඩයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 68. | අයිස් ක්‍රීම් විකිණීමේ හෝ නිෂ්පාදනය කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 69. | (බලපත්‍ර ලත්) සකස් කරන තේ කුඩු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 70. | ව්‍යාපාරික වශයෙන් පැණි හෝ හකුරු නිෂ්පාදනය කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 71. | ගැලුම් 25ට අධික පොල් තෙල් ගබඩා කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 72. | විනාකිරි නිපදවීමේ හෝ ගබඩා කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 73. | පපඩම් නිෂ්පාදනය කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 74. | ලුණු පැකට් කිරීමේ මධ්‍යස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 75. | තේ කර්මාන්තශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 76. | යකඩ වැඩ කරන කම්හලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 77. | අත් යන්ත්‍ර පේෂ කර්ම ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 78. | පිත්තල භාණ්ඩ සැකසීම හා නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 79. | සිනමාශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 80. | ස්වර්ණාභරණ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 81. | ස්වර්ණාභරණ නිපදවීම හෝ අළුත්වැඩියා කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 82. | ඇඟළුම් කර්මාන්තශාලාවක් හෝ බලවේග පෙහෙකම්හලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 83. | අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තැබීමේ ස්ථානයක් හෝ විකිණීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 84. | හිස් ගෝනි, හිස් බෝතල්, පරණ කඩදාසි ආදිය ගබඩා කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 85. | ගිණිපෙට්ටි නිපදවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 86. | ඩ්‍රයික්ලීන් කිරීමේ ස්ථානයක් හෝ ලොන්ඩරියක් | 500 0 | 750 0 | 1,000 0 |
| 87. | තොග වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 88. | සිල්ලර හෝ කුළුබඩු කඩයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 89. | එළවළු, පළතුරු වෙළෙඳසැලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 90. | කපු පුලුන් ගබඩා කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 91. | පුවක් සකස් කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 92. | සුරුට්ටු හෝ බීඩි නිෂ්පාදනය කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 93. | දුම්කොළ උදුන් | 500 0 | 750 0 | 1,000 0 |
| 94. | දුම්කොළ ගබඩා කිරීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 95. | මුද්‍රණාලයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 96. | රබර් සීල් මුද්‍රණය කිරීමේ මධ්‍යස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 97. | ප්ලාස්ටික් බඩු හා ප්ලාස්ටික් නාම පුවරු සකස් කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 98. | රියදුරු පුහුණු ආයතන | 500 0 | 750 0 | 1,000 0 |
| 99. | සබන් නිෂ්පාදනය කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 100. | සම් ගබඩා කිරීමේ හෝ පදම් කිරීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | ව්‍යාපාර ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත |
|---|---|---|---|---|
| 101. | සුවඳ විලවුන්, හඳුන් කූරු ඉටිපන්දම්, අලෙවිය/නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 102. | සුළු අපනයන බෝග ගබඩා කිරීම/වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 103. | කුළුබඩු, සුළු අපනයන බෝග, ධාන්‍ය වර්ග අසුරා (පැකට් කර) විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 104. | එල්ජී ගෑස් විකිණීමේ මධ්‍යස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 105. | සංචාරක වෙළෙඳාම කරත්ත/වාහන | 500 0 | 750 0 | 1,000 0 |
| 106. | බාබර් සාප්පුවක් සහ කොණ්ඩා සකස් කිරීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 107. | උත්සව සමයේ තාවකාලික වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 108. | පෞද්ගලික දුරකථන, ගුවන්විදුලිය හා රූපවාහිනී සම්ප්‍රේෂණ කුලුණු | 500 0 | 750 0 | 1,000 0 |

**උපලේඛන අංක 02**

ඇතැම් කර්මාන්ත සහ වෙළෙඳාම සම්බන්ධව බදු 150 වැනි වගන්තිය

| | | | | |
|---|---|---|---|---|
| 1. | ඉංග්‍රීසි බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | දේශීය බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | ඉංග්‍රීසි බෙහෙත් ශාලාවක් | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | දේශීය බෙහෙත් ශාලාවක් | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම (බටහිර) | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | රෙදිපිළි විකිණීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | ඇඳුම් මැසීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | පරණ රෙදි විකිණීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | පාවහන් වෙළෙඳාම් කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | පාවහන් සහ සම් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | පොත් පත්, ලිපිද්‍රව්‍ය ගබඩා කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ගුවන් විදුලි යන්ත්‍ර රූපවාහිනී යන්ත්‍ර, මහන මැෂින් | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | රෙකෝඩ් බාර් | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | වීඩියෝ පට/තැටි අලෙවි කිරීම, කුළියට දීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ගෘහ භාණ්ඩ වෙළෙඳසැලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | මෝටර් රථ අමතර කොටස් වෙළෙඳසැලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ටයර්, ටියුබ් වෙළෙඳසැලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | පා පැදි අමතර කොටස් වෙළඳෙසැලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | වාහන සේදීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | දත් බඳින ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | ඇස් කණ්නාඩි වෙළෙඳසැලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | මල් වෙළෙඳසැලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | මල් පැල වෙළෙඳසැලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | විසිතුරු බඩු/ඇළුමිනියම් බඩු විකිණීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | සාප්පු බඩු අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | මිරිස් හෝ ධාන්‍ය ඇඹරුම්හලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | බිම් මල් හා ආහාර ද්‍රව්‍ය නිපදවීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | ටින් කෑම, කිරි පිටි, බිස්කට්, විකිණීමේ ස්ථානයක් නොහොත් ග්‍රොසරියක් | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | බුලත් පුවක් විකිණීම සඳහා ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | කිරි අලෙවි සැලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | රා විකිණීම (බෝතල් රා) | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | බියර් විකිණීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | මත්පැන් (අරක්කු) අලෙවිසැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | තේ දළු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | රජයේ පිළිගත් ලොතරැයි විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | ඡායාරූප ශාලාවක් | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | වීඩියෝ දර්ශන පෙන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | නියෝජ්‍ය තැපැල් කාර්යාලයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | දුරකථන සේවා සැපයීම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | ඡයා පිටපත් කිරීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | ෆැක්ස් පණිවිඩ යැවීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | ඊමේල් පණිවිඩ යැවීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | පරිගණක පන්ති පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | පරිගණක අකුරු සැකසීම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | පරිගණක අමතර කොටස් සහ පරිගණක අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | ව්‍යාපාර ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත |
|---|---|---|---|---|
| 46. | පෞද්ගලික උපකාරක පන්ති පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | වළං වෙළඳාම/මැටි භාණ්ඩ | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | උත්සව භාණ්ඩ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | බෝට්ටු සේවාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | මැණික් මිලට ගැනීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | සනීපාරක්ෂක උපකරණ කට්ටල අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | පිත්තල භාණ්ඩ සැකසීම හා නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | ෆයිබර් ග්ලාස් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | බතික් වැඩපලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | පිඟන්, වීදුරු බඩු විකිණීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | වැසිකිළි ආරක්ෂක ආවරණ කට්ටල අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |

*උපලේඛන අංක 03*

*152 වැනි වගන්තිය යටතේ ඇතැම් ව්‍යාපාර හා වෘත්තීන් සම්බන්ධ බදු*

මෙම බද්ද ගෙවිය යුතු වර්ෂයට ඉහතින් වූ වර්ෂයේ ලැබීම්වලට අනුකූලව පහත දැක්වෙන ප්‍රමාණයන් නොඉක්මවන පරිදි වේ.

| *ව්‍යාපාරයේ වාර්ෂික වටිනාකම* | *ගෙවිය යුතු වාර්ෂික බද්ද* *රු. ශත* |
|---|---|
| රු. 6,000 0ට වැඩි රු. 12,000 0 ට අඩු | 135 0 |
| රු. 12,000 0 වැඩි රු. 18,750 ට අඩු | 270 0 |
| රු. 18,750 ට වැඩි රු. 75,000 0 ට අඩු | 540 0 |
| රු. 75,000 ට වැඩි රු. 150,000 ට අඩු | 1,800 0 |
| රු. 150,000 ට වැඩි | 3,000 0 |

*මෙම බදු අදාළ වන ව්‍යාපාර :*

1. කොමිස් ඒජන්තවරු
2. වෙන්දේසිකරුවන්
3. බ්‍රෝකර්වරුන්
4. මුදල් ආයෝජකයින්
5. මුදල් ණයට දෙන්නන්
6. කොන්ත්‍රාත්කරුවන්
7. උකස් බඩු ගන්නන්
8. පෞද්ගලික පන්ති පවත්වන්නන්
9. ගණන් පරීක්ෂකවරුන්
10. ගෘහ නිර්මාණ ශිල්පීන්
11. සැපයුම්කරුවන්
12. රක්ෂණ නියෝජිතයින්
13. ප්‍රවාහන නියෝජිතයින්
14. කුලී කාර් අයිතිකරුවන්
15. මෝටර් රථ වෙළඳාම් කරුවන්
16. බැංකු හා රක්ෂණ සමාගම්
17. රියදුරු පුහුණු ආයතන
18. නීතිඥවරුන්, ප්‍රසිද්ධ නොතාරිස්වරුන්, පෞද්ගලික වෛද්‍යවරුන්, මිනින්දෝරුවරුන් ආදී සෑම අයෙකුම
19. මත්පැන් වර්ග, රට බීම සාප්පුවක් පවත්වන්නෙකු
20. රේස් ඔට්ටුකරුවන්
21. ලොතරැයි අලෙවි කුටි පැවැත්වීම
22. මත්පැන් තොග බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
23. බලපත්‍රලත් මත්පැන් නිෂ්පාදන
24. විදේශ රැකියා නියෝජිත ආයතන
25. කාඩ් මගින්, කාසි මගින් දුරකථන ඇමතුම් ලබාගත හැකි ප්‍රධාන නගරවල සවිකර ඇති දුරකථන පුවරු
26. සිසිල් බීම නියෝජිතයින්
27. කුඩා ප්‍රමාණයේ විදුලි බලාගාර පවත්වාගෙන යාම
28. පෞද්ගලික දුරකථන, ගුවන් විදුලි හා රූපවාහිනී සම්ප්‍රේෂණ කුළුණු
29. චන්ද්‍රිකා තාක්ෂණයෙන් රූපවාහිනී සේවාවන් සැපයීම
30. අන්තර්ජාලය හරහා සංචාරක බ්‍රෝකර්වරුන් ලෙස ක්‍රියා කිරීම
31. සීට්ටු මගින් භාණ්ඩ අලෙවි කිරීම

*උපලේඛන අංක 04*

*අඹගමුව ප්‍රාදේශීය සභාවේ වෙනත් ගාස්තු පිළිබඳ අයකුම*

01. ශ්‍රී පාද වන්දනා සමයේ නල්ලතන්නිය නගරයේ වාහන නැවතුම් ගාස්තු :

| | රු. ශත |
|---|---|
| බස් රථ සඳහා | 150 0 |
| වෑන් රථ සඳහ | 100 0 |

02. අනෙකුත් වාහන නැවතුම් ගාස්තු :

| | |
|---|---|
| ලොරි/බස් රථ/වෑන් රථ (මාසික නැවතුම් ගාස්තු) | 200 0 |
| නගරවල නවත්වනු ලබන රථවාහන සඳහා (එක් වාහනයකින්) - | |
| මුල් පැය 03 සඳහා | 20 0 |
| වැයවෙන පැයක් වෙනුවෙන් (පැයකට) | 10 0 |
| ත්‍රිරෝද රථ ලියාපදිංචි ගාස්තු | 1,000 0 |
| ත්‍රිරෝද රථ මාසික නැවතුම් ගාස්තු | 150 0 |

ගොඩනැගිලි ඉදි කිරීම කොටසක් එකතු කිරීමේ ලියාපදිංචි ගාස්තු :

| *වර්ග අඩි* | *ගෘහස්ථ* *රු. ශත* | *ව්‍යාපාරික* *රු. ශත* |
|---|---|---|
| 0 - 500 | 1,000 0 | 1,750 0 |
| 500 - 1000 | 1,250 0 | 2,250 0 |
| 1,000 - 1,500 0 | 2,250 0 | 3,000 0 |
| 1,500 - 2,000 0 | 2,500 0 | 4,250 0 |

වර්ග අඩි 2,000ට වැඩි වන සෑම වර්ග අඩි 500ක් වෙනුවෙන් රු. 1,000 බැගින් වැඩි වේ.

ඉඩමේ අණු කොටස්වලට බෙදීම සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම.

(i) නේවාසික සඳහා වූ ඒකකයක භාවිතය වෙනස් කිරීම
- වර්ග මීටරයකට රු. 1,500

(ii) ඉඩම අණු බෙදුම සඳහා -
(අ) එක් බිම් කොටසකට රු. 1,500 0 බැගින්
(ආ) ආවරණ අනුමැතිය සඳහා බිම් කොටසකට රු. 2,000 බැගින්

(iii) දුරකථන/විදුලි සංදේශ කුළුණු -

(අ) පෙරසැරි ගාස්තු, උස මීටර් 01 සඳහා රු. 5,000 බැගින්
(ආ) ආවරණ අනුමැතිය සඳහා උස සෑම මීටර් 05 සඳහා රු. 2,000 බැගින්

04. සේවා සැපයීම, වාර්තා කිරීම හෝ වෙනත් සේවා සඳහා :

1. මූලික සැලසුම් නිරාකරණය අනුමැතිය, සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම, අනුකූලතා සහතික නිකුත් කිරීම, ආදී කටයුතු පරීක්ෂා කිරීම පිණිස නිලධාරීන් ගමන් කළ යුතු දුර ප්‍රමාණය වෙනුවෙන් දුර කි. මී. 25ට අඩු වේ නම් රු. 750 ක් හා වැඩි වන සෑම කි. මී. 01කට රු. 25 බැගින් විය යුතුයි.

| | | *ගෘහස්ථ* *රු. ශත* | *ව්‍යාපාරික* *රු. ශත* |
|---|---|---|---|
| (i) | ගොඩනැගිලි අයදුම්පත් පරීක්ෂණ ගාස්තු | 500 0 | 1,000 0 |
| (ii) | ගොඩනැගිලි අයදුම්පත්වල වලංගු කාලය දීර්ඝ කිරීම (වසරක් සඳහා) | 500 0 | 1,000 0 |
| :(iii) | ගොඩනැගිලි අනුමත නොකර ඉදි කිරීමේදී අයකරන දඩ මුදල් (වර්ග මීටරයට) | 500 0 | 2,000 0 |

| | | *ගෘහස්ථ* *රු. ශත* | *ව්‍යාපාරික* *රු. ශත* |
|---|---|---|---|
| (i) | ගොඩනැගිලි අයදුම්පත් ගාස්තුව | 500 0 | 1,000 0 |
| (ii) | ජල අයදුම්පත් ගාස්තු | 200 0 | 500 0 |
| (iii) | නම සංශෝධනය කිරීමේ පෝරම ගාස්තු | 500 0 | 1,000 0 |
| (iv) | විථි රේඛා හා නොපවරා ගැනීමේ සහතික ගාස්තු | 2,000 0 | 3,000 0 |
| (v) | විදුලිය ලබා ගැනීමේ නිර්දේශිත ලිපි ගාස්තු | 1,000 0 | 1,500 0 |
| (vi) | දැව ප්‍රවාහන ගාස්තු (සහාව සතු මාර්ගවල එක් වරකට) - | | |
| (vii) | ටොන් 15ට අඩු | 3,500 0 | - |
| (viii) | ටොන් 15ට වැඩි | 10,000 0 | - |

* පදිංචි අනුකූලතා සහතික ගාස්තු (නිවාස හා නගර ආඥාපනතේ විධිවිධාන අනුව) :

| *වර්ග අඩි* | *ගෘහස්ථ* *රු. ශත* | *ව්‍යාපාරික* *රු. ශත* |
|---|---|---|
| 0-500 | 500 0 | 750 0 |
| 500 - 1000 | 750 0 | 1,250 0 |
| 1000 - 1500 | 1,500 0 | 2,000 0 |
| 1500 - 2000 | 2,000 0 | 2,500 0 |
| 2000ට වැඩි | 3,250 0 | 5,250 0 |

* දුරකථන/විදුලි සංදේශ කුළුණු - උස සෑම මීටරයකටම 1,000 බැගින්

* ලේඛන සෙවීමේ ප්‍රතිඵල සහතික කිරීමේ ගාස්තුව :

| | *පළමු වසර* *රු. ශත* | *අනෙකුත් වසර (එකක් සඳහා)* *රු. ශත* |
|---|---|---|
| ලේඛන සෙවීම | 200 0 | 100 0 |
| පිටපත් කිරීම | 75 0 | 15 0 |
| පරීක්ෂා කිරීම | 150 0 | 10 0 |

| | *තාවකාලික* *රු. ශත* | *ස්ථිර* *රු. ශත* |
|---|---|---|
| නාම පුවරු ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු වර්ග අඩි 01කට | 150 0 | 200 0 |
| නාම පුවරු ඉවත් කිරීම සඳහා ගාස්තු (ප්‍රදර්ශන කාල සීමාවෙන් පසුව) එකක් සඳහා | 75 0 | |

| | *ගෘහස්ථ* *රු. ශත* | *ව්‍යාපාරික* *රු. ශත* |
|---|---|---|
| *වතුර බවුසරය කුලියට දීම (එක් වරකට)* | 750 0 | 1,000 0 |
| කි. මී. 01 ක් සඳහා | 30 0 | 30 0 |
| අපද්‍රව්‍ය ඉවත් කිරීමට ට්‍රැක්ටරය කුලියට දීම (කර්මාන්තශාලා සඳහා) එක් වරකට | | 1,500 0 |
| සංචාරක හෝටල් සඳහා) එක් වරකට | | 750 0 |

| *ගලි බවුසරය කුලියට දීම* (එක් වරකට) | *බල ප්‍රදේශය තුළ* | *බල ප්‍රදේශයෙන් පිටත* |
|---|---|---|
| නිවාස සඳහා | 4,000 0 | 6,000 0 |
| සාමාන්‍ය වෙළඳසල් සඳහා | 5,000 0 | 7,000 0 |
| හෝටල්, බේකරි, ආපන ශාලා සඳහා | 6,000 0 | 8,000 0 |
| සංචාරක මණ්ඩලයේ අනුමැතිය ලද සංචාරක හෝටල් සඳහා | 7,000 0 | 10,000 0 |
| ධාවනයේ යෙදෙන කිලෝමීටර් 01 සඳහා | 60 0 | 60 0 |
| *ට්‍රැක්ටරය කුලිය දීම* | | |
| කිලෝමීටර් එකක් සඳහා | 40 0 | 40 0 |
| ට්‍රැක්ටර් කුළියට දීම (පැය 8ක් සඳහා) | 3,500 0 | 3,500 0 |
| ආදාහනාගාරය වෙන් කිරීම (එක් දේහයක් සඳහා) | 10,000 0 | 12,000 0 |
| බිම් කුළියට දීමේ ගාස්තුව (දිනකට) | 3,000 0 | |
| ක්‍රීඩා පිටිය බදු දීමේ ගාස්තුව (දිනකට) | 1,500 0 | |
| සැපයුම්කරුවකු වශයෙන් ලියාපදිංචි කිරීමට (එක් අංකයක් සඳහා) | 500 0 + 1% මුද්දර බදු | |

කොන්ත්‍රාත් සඳහා

| | |
|---|---|
| 01. රු. 25,000 0 දක්වා | රු. 625 + 1% මුද්දර බදු |
| 02. රු. 25,000 සිට රු. 50,000 දක්වා | රු. 750 + 1% මුද්දර බදු |
| 03. රු. 50,000 0 සිට රු. 1,00,000 0 දක්වා | රු. 1,000 + 1% මුද්දර බදු |
| 04. රු. 1,00,000 සිට රු. 2,50,000 දක්වා | රු. 1,500 + 1% මුද්දර බදු |
| 05. රු. 2,50,000 0 සිට රු. 5,00,000 දක්වා | රු. 2,000 + 1% මුද්දර බදු |

12-157/2

### වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව

ජාතික පරිසර පනත යටතේ දැන්වීම් -2014

1980 වර්ෂයේ 47 වැනි අංකයේ ජාතික පරිසර අධිකාරි සභාවේ 1980 වර්ෂයේ 47 වැනි අංකයේ ජාතික පරිසර පනත 1988 වර්ෂයේ 56 වැනි අංක සංශෝධන පනත සැලැස්ම අනුව මධ්‍යම පරිසර උක්ත පනතේ 26 වැනි කොටසට අයත් සිවේත උපමාවේ පලය අනුව 2001 වර්ෂයේ සැප්තැම්බර් මස 01 වැනි දින පටන් පහත දක්වන උපලේඛනයෙන් කියා සිටි පරිදි උපමාව ද රාජකාරිය ද සේවය ද ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාට බාරදුන් පනතේ දක්වන වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ මෙම පනත ක්‍රියාත්මක වන පරිදි පහත දක්වන උපලේඛනයේ පෙන්වා සිටින කර්මාන්තය වෙත මධ්‍යම පරිසර අධිකාරිය මගින් දක්වා ඇති අන්දමට ලැයිස්තු ද, ගාස්තු ද, පරීක්ෂා ගාස්තු බලපත්‍ර ගාස්තු ද ආදිය අනුමත කළ අය කිරීම් කරනු ලබන බව මෙයින් තීරණය කර ප්‍රකාශ කරමි. මෙම ප්‍රකාශ මගින් අයකරන ලද ගාස්තු 1987 වර්ෂයේ 15 වැනි අංක ප්‍රාදේශීය සභා පනත යටතේ අනුමත කර අය කරන බලපත්‍ර ගාස්තුවට වඩා ඉහළිනුත් ඒවා කොයි ආකාරයෙනුත් බඳු නොවන ආකාරය ද වේ.

උපලේඛනය

1. සංඛ්‍යා 25ට අඩු සේවකයින් සේවයට පත් කරමින් සබන් කුණු ඉවත් කරන හෝ වෙනත් යම් කිසි පිරිසිදු භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවල්
